**පළමු මුද්‍රණය:**
වර්ෂ 2013 ඔක්තෝබර් මස
පිළියන්දල ගුඩ්වුඩ් ප්‍රින්ටර්ස් ආයතනය

**දෙවනි මුද්‍රණය:**
වර්ෂ 2015 ඔක්තෝබර් මස
පිළියන්දල ගුඩ්වුඩ් ප්‍රින්ටර්ස් ආයතනය

**තෙවන මුද්‍රණය:**
වර්ෂ 2016 ඔක්තෝබර් මස
පිටකෝට්ටේ, ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය

**හතරවන මුද්‍රණය:**
වර්ෂ 2018 ජූලි මස
පිටකෝට්ටේ, ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලය

**පරිගණක පිටු සැකසුම:**
ගොඩගම පිනකල් නෙට් ආයතනය,
මහරගම යූ. එන්. ප්‍රින්ටර්ස් ආයතනය,
හොරණ, ගයාන් දසනායක මහතා

**පිටකවර නිර්මාණය:**
නුගේගොඩ, ප්‍රභා කුලරත්න මහතා

# පිදුම

වසර සියයක් නොව, වසර දහසක් නොව, වසර කෝටියක්ද නොව, සාරාසංඛ්‍ය කල්ප ලක්ෂයක් පාරමිතා දම් පුරා උතුම් වූ ශ්‍රී සද්ධර්මය මතු කර දෙමින් ලෝක සත්වයාට මහා දයානුකම්පාවෙන් දේශනා කළා වූ මේ ලොව පහළ වූ සියළු උතුම් ලොව්තුරා බුදු පියාණන් වහන්සේලාටත්,

ඒ අති උතුම් වූ ශ්‍රී සද්ධර්මය ආරක්ෂා කර ගනිමින් ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කොට ආරක්ෂිතව දීර්ඝ කාලයක් පුරාවට රැගෙන ආ සියළු මහ රහතන් වහන්සේලා ප්‍රමුඛ මහා සංඝ රත්නයටත්,

මේ අනන්ත සසර ගමනේ තව දුරටත් අනාථයෝ නොවී, මේ සසර කතරින් මිදීමට, නිවී සැනසෙන උතුම් නිවන් සුවයම අර්ථ, ධර්ම, නිරුක්ති, පටිභාන සහිතව මතු කර දෙමින් සැඟවුණු බොදු මඟ යළි පුබුදුවන පූජ්‍යපාද වහරක අභයරතනාලංකාර හිමිපාණන් වහන්සේටත් මාගේ මේ අග්‍ර වූ, ශ්‍රේෂ්ඨ වූ, අද්විතීය වූ, අසම සම වූ නමස්කාරය වේවා!

| | |
|---|---|
| මග වෙහෙස | නොබලා |
| හරවත් ලොවක් | පතලා |
| ලබා දෙන්නට | හිතලා |
| දිරිය දුනි මව් පියන් | මෙකලා |

මේ වෙහෙසකර අනාථ සසරේ මිනිසත් කයක් ලබනට මා මහා දාහයකින් යුතුව කොපමණ කලක් බලා සිටියාදැයි නොදනිමි. එය අනන්ත කාලයක් විය හැකිය. එසේ සැරි සරන මා මෙලොවට ගෙන ආ මාගේ දයාබර දෙමාපියන්ටත්,

ඒවාගේම, නිවන් මග බලා පියනඟන මා හට ඔවදන් දෙමින්ද, සිදු කරන ශාසනික මෙහෙවර උදෙසා මග පෙන්වමින්ද, දයාබර පියෙකු සේම, කලණ මිතුරෙකු සේද මා හට ශක්තියක් වූ ගොඩගම මාමාටත් (ගොඩගම ආර්. එච්. එම්. දිසානායක මහතා) මාගේ උපහාරය මෙසේ පුද කර සිටින්නෙමි.

## පටුන


නිවන අදිටන් කර ගැනීම ..... 5
නමස්කාරය ..... 6
තිසරණය..... 6
සුචරිත අදිෂ්ඨාන ..... 6
සිසිල් පැන් / අෂ්ඨ පාන / ගිලන් පස පූජාව ..... 7
අෂ්ඨ පාන ගිලන් පස පූජාව..... 7
ආයුෂ, වර්ණ, සැප, බල, පටිභාන ඥානය ගෙන දෙන භෝජන පූජාව ..... 8
පළතුරු / කැවිලි / අවුල්පත් / කිරි පැණි ආදිය පූජා කිරීම..... 8
ඖෂධීය සුගන්ධවත් දැහැත් පූජාව ..... 9
අට පිරිකර පූජාව..... 9
මෙතෙක් නොකලා වූ සියලු දේ එකවර පූජා කිරීම ..... 10
සීල ගුණය වඩන මල් පූජාව..... 10
සමාධිය වඩන හඳුන්කූරු පූජාව ..... 11
ප්‍රඥාවෙන් වඩන පහන් ආලෝක පූජාව ..... 11
චෛත්‍ය වන්දනාව ..... 12
ජය සිරි මහ බෝ සමිඳුන් වන්දනා කිරීම..... 13
ජය සිරි මහ බෝ සමිඳුන් පිදූ පිනෙන් සෙත් ලබා ගැනීම..... 14
අට විසි බුද්ධ වන්දනා කවි ..... 16
අප්‍රමාණ බුද්ධ ශක්තියේ රැකවරණය ලබා ගැනීම ..... 18
කරණීය මෙත්ත සූත්‍රය ..... 20
මහා මංගල සූත්‍රය ..... 21
රතන සූත්‍රය..... 22
මෙත්තානිසංස සූත්‍රය ..... 24
ජය පිරිත ..... 24
දස දිසා පිරිත ..... 26
මෝර පිරිත..... 27
භාවනා කිරීමට ප්‍රථම වැඩිය යුතු පූර්ව කෘත්‍ය ..... 28
භාවනා කිරීමට පෙර කියන ආශිර්වාද ගාථා..... 28
ආර්ය මෛත්‍රී භාවනාව ..... 29
සත් බුද්ධ නමස්කාරය ..... 30
කර්මස්ථානය..... 31
නව ගුණ ශාන්තිය ..... 31
යමෙකු රෝගී වූ අවස්ථාවක ..... 33
වැරදි කමා කර ගැනීම ..... 34
පින් අනුමෝදනා කිරීම..... 35
ප්‍රාර්ථනය..... 35
මෙම ධර්ම ග්‍රන්ථය මුද්‍රණයට දායකත්වය ලබා දුන් පිංවත් පිරිස ..... 37

# පෙරවදන

මේ සසර කතරේ වෙහෙස නිවා ලන්නට මට මුණගැසුනු පළමු කළණ මිතුරාද ඔබයි පියාණනි. බහ තෝරන විය පටන්ම උතුම් වූ දහමටම අප සිත් යා කොට අපට තනා දුන් දහම් සෙවණ මෙලොව කිසිදු භෞතික වස්තුවකට සම කළ නොහැක. එදා ඔබ නිසා මා ගොනු කර ගත් ඒ මහා පුණ්‍ය ශක්තීන් අද මෙසේ සැඟවුණු බොදු මගේ සාරය දෝතින් ගන්නට උපනිශ්‍රිය වුණා නිසැකය.

මේ උතුම් ග්‍රන්ථය තුළින් ජනිත කුසලය මියගිය ඩී. විජේසූරිය වන අපගේ දයාබර පියාණන්ට අනුමෝදන් කරමි.

ඒවාගේම අපගේ දයාබර පියාණන් ඇතුළුව අනන්ත සසරේ අපට දෙමාපියන් වූ සියළු සත්වයින්ටත්, දිව්‍ය, බ්‍රහ්ම, මනුෂ්‍ය, අමනුෂ්‍ය කියන්නා වූ සතර වරිගයක ඥාති හිතමිත්‍රාදීන්ටත්, අනන්ත සසර ගමනේ මේ මොහොත දක්වාම අපට උදව්වක් උපකාරයක් කළ දෙමාපිය, ගුරුවරු, ඥාති හිතමිත්‍රාදීන්ටත් මේ අනන්ත සසර ගමනේ අපගේ සිත, කය, වචනය යන තිදොරින් අවැඩක්, අසාධාරණයක්, වරදක්, ප්‍රමාද දෝෂයක් සිදු වූ ලෝක සත්වයින් කිසියම් භවයක, කිසියම් උපතක සිටියත් ඒ සැම සියළු දෙනාගේම සසර ගමන සැපවත් වීමට හේතු වේවා! එමෙන්ම මෙම ග්‍රන්ථය තුළින් නික්මෙන කුසලය මහා කුසල් ගංගාවක් සේ, මහා පුණ්‍ය ගංගාවක් සේ විහිදී පැතිරී පිහිටා චන්ද්‍ර, සූර්යයා ලොව බබුළුවන්නා සේ ආර්ය, සීල, සමාධි, ප්‍රඥා ඥාන පහළ වී උතුම් වූ නිවන් සාක්ශාත් කර ගැනීමට හේතු වාසනා පහළ කෙරෙත්වා!

චායා සංජීවනී විජේසූරිය
මහරගම.
දුර: 077-8338683

# නිවන අදිටන් කර ගැනීම

(වන්දනාමාන පූජා ඇරඹීමට පෙර මේ අදිටන් වාක්‍ය කියවන්න)

අනන්ත ගුණැති සම්මා සම්බුදු පියාණන් වහන්සේලාගේ අනන්ත අප්‍රමාණ වූ මහා ගුණස්කන්ධයන්ගේ ආනුභාවයෙන්ද,

උතුම් වූ ශ්‍රී සද්ධර්ම රත්නයේ අනන්ත අප්‍රමාණ වූ මහා ගුණස්කන්ධයේ ආනුභාවයෙන්ද,

උතුම් වූ මහා සංඝ රත්නයේ අනන්ත අප්‍රමාණ වූ මහා ගුණස්කන්ධයේ ආනුභාවයෙන්ද,

මේ කියන්නා වූ ත්‍රිවිධ රත්නයේ අනන්ත අප්‍රමාණ මහා ගුණ ආශිර්වාද බල මහිමය හේතු කොටගෙනද සම්මා සම්බුදු පියාණන් වහන්සේලාගේ සාරාසංඛ්‍ය අටාසංඛ්‍ය සොළොසාසංඛ්‍ය කල්ප ලක්ෂ ගණනින් පූර්ණය කරගෙන ආවා වූ අනන්ත ගුණ ඇති මහා පාරමිතා බල මහිමයන් හේතු කොට ගෙන සම්බුදු පියාණන් වහන්සේලාගේ ශ්‍රී මුඛ බුද්ධ විවරණයෙන් ලැබුවා වූ අප්‍රමාණ ආශිර්වාද බල මහිම හේතු කොට ගෙන තුන් ලෝකාග්‍ර වූ ලොව්තුරා සම්බුද්ධත්වයට පත්වීමට මහා සැනසිල්ල ශාන්තිය උදාකර දෙන්නා වූ ජය ශ්‍රී මහා බෝධි රාජයාණන් වහන්සේලා ලොව විද්‍යමාන වී වදාළ ඒ ශ්‍රේෂ්ඨ වන්නා වූ ජය ශ්‍රී මහා බෝධි රාජයාණන් වහන්සේලාගෙන් නැගුනා වූ ද නැගෙන්නාවූ ද අනන්ත ආශිර්වාදයන් අපට මහා රැකවරණයක්, ආශිර්වාදයක්, පිළිසරණක් වේවා.

ඒ වාගේම සියළු බය, තැති ගැනුම්, දුක් දොම්නස්, ලොමු ඩැහැ ගැනුම් දුරු කරමින් සියලු දුර්භික්ෂ බය, රෝග බය, අමනුෂ්‍ය බය දුරු කරමින් සියලු යහපතින් ජයග්‍රහණයෙන්, අභිවෘද්ධියෙන් යුතුව උතුම් වූ නිවන් සාක්ශාත් කර ගැනීමට මේ මහා ශාන්තිය අපට උපනිශ්‍ර සම්පත්තියක් වේවා!

අප පමණක් නොව දිව්‍ය, බ්‍රහ්ම, මනුෂ්‍ය, අමනුෂ්‍ය ආදී සතර වර්ගයක ඥාති මිත්‍රාදීන් යම්තාක් අය ඇත්ද එසේම මේ පින් අනුමෝදන් වීමට බලාපොරොත්තු වන්නා වූ යම් තාක් ඇත්ද ඒ සියළු දෙනාද අප්‍රමාණ ලෝක වාසී සියලු සත්වයෝද මේ වන්දනාමාන පූජා සත්කාරයන් තම තමන් විසින් අතහිත දී ගනිමින් සිදුකරන්නා වූ වන්දනාමාන පූජා සත්කාරයන් සේ සිහිකර ගනිත්වා.

අනන්ත සසර පටන් මේ මොහොත දක්වා අපට උදව් උපකාර කළ දෙමාපිය, ගුරුවර, ඥාති හිත මිත්‍රාදීන් කෙබඳු භවයක, කෙබඳු උපතක සිටියත් මේ වන්දනාමාන පුද පූජාවන්ගේ පුණ්‍ය ශක්තිය හේතු කොට ගෙන ඒ සියල්ලෝම සුවපත් වෙත්වා. එපමණක් නොව අනන්ත සසර ගමනේදී අපගෙන් අවැඩක්, අසාධාරණයක්, වරදක්, ප්‍රමාද දෝෂයක් සිදු වූ ලෝක සත්වයින් කෙබඳු භවයක, කෙබඳු උපතක සිටියත් මේ වන්දනාමාන පුද පූජාවන්ගේ පුණ්‍ය ශක්තිය විඳිදී පැතිරී පිහිටා සුඛිත මුදිත වෙත්වා. කිසි කලෙකත් ඒ අයට දුගතියක් නොවෙත්වා. යහපතින් අභිවෘද්ධියෙන් යුතුව නිවන් සාක්ෂාත් කර ගැනීමට හේතු වාසනා වෙත්වා. මෙසේ එම අවැඩ අසාධාරණයන්ට වන්දි ගෙවා නිදහස් වෙත්වා.

අනන්ත සසර තුළ අප විසින් කරන ලද යම් පාප ක්‍රියාවන්, අකුසල ක්‍රියාවන් කොපමණ ඇත්ද, ඒ සියල්ල මේ පුණ්‍ය ශක්තිය හේතු කොට ගෙන දුරු වී, අප විසින් සසරදී කරන ලද යම් පුණ්‍ය ක්‍රියාවන්, කුසල ක්‍රියාවන් ඇත්නම් ඒවා මතු වී අපට තිබෙන්නා වූ සියලු දුක් කරදර හා දෝසාන්ධකාරයන් ද අපල උපද්‍රව හා රෝග බය, අමනුෂ්‍ය බය ද දුරු වී නිවන් සාක්ෂාත් කර ගැනීමට හේතු වාසනා පහළ වෙත්වා!

සාධු! සාධු! සාධු!

## නමස්කාරය

මේ තුන් ලෝකාග්‍ර වූ සම්මා සම්බුදු පියාණන් වහන්සේලාට, උතුම් වූ සද්ධර්ම රත්නයට, උතුම් වූ සංඝ රත්නයට මාගේ මේ අග්‍ර වූ ශ්‍රේෂ්ඨ වූ නමස්කාරය වේවා!

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**

## තිසරණය

**බුද්ධං සරණං ගච්ඡාමි**
**ධම්මං සරණං ගච්ඡාමි**
**සංඝං සරණං ගච්ඡාමි**

**දුතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි**
**දුතියම්පි ධම්මං සරණං ගච්ඡාමි**
**දුතියම්පි සංඝං සරණං ගච්ඡාමි**

**තතියම්පි බුද්ධං සරණං ගච්ඡාමි**
**තතියම්පි ධම්මං සරණං ගච්ඡාමි**
**තතියම්පි සංඝං සරණං ගච්ඡාමි**

(මෙහි ලෝකෝත්තර අදහස: පළමුව ද, දෙවනුවද, තෙවනුවද භවය උදුරා හරිමින් ධර්මය දරමින් අවිද්‍යාව, තණ්හාව බිඳ හරිමින් සසර ගමන කෙළවර කරමි යනුයි).

## සුචරිත අදිෂ්ඨාන

(පංච ශික්ෂා පද සමාදන්ව රැකීමට නොහැකිව ඒවා කැඩීමෙන් ධර්මාවබෝධයට බාධා ඇති ඒ අණාවීතික්කමාවරණය යන බුදු වදන කැඩීමේ වරදට හසුවීමෙන් නිවණ ආවරණය වන බැවින් මෙසේ සුචරිතය අදිටන් කර ගනිමු).

**මම සතුන් නොමරමි**
**සොරකම් කිසිත් නොකරමි**
**දුසිරිතෙන් දුරු වෙමි**
**බොරු බසින් මත් පැනින් වළකිමි**

ඉතිපි/ සෝ භගවා/ අරහං/ සම්මා සම්බුද්ධෝ/ විජ්ජාචරණ
සම්පන්නෝ/ සුගතෝ/ ලෝකවිදූ/ අනුත්තරෝ පුරිස දම්ම සාරති/
සත්තා දේව මනුස්සානං/ බුද්ධෝ/ භගවාති

ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ/ සන්දිට්ඨිකෝ/ අකාලිකෝ/ ඒහිපස්සිකෝ/ ඕපනයිකෝ/ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහීති

සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ/ උජුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ/ ඤායපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ/ සාමීචිපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ/

යදිදංචත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිස පුග්ගලා ඒස භගවතෝ සාවක සංඝෝ/ ආහුණෙයියෝ/ පාහුණෙයියෝ/ දක්ඛිණෙයියෝ/ අඤ්ජලිකරණීයෝ/ අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සා ති.

## සිසිල් පැන් / අෂ්ඨ පාන / ගිලන් පස පූජාව

කරුණා මෛත්‍රී සිසිල් ජලාශයන් ලොවට විද්‍යාමාන කරමින් විහිදුවා වදාළා වූද නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්ම රත්නය නමැති සදහම් අමා පානය ලොවට

විද්‍යාමාන කර විහිදුවා වදාළා වූ ද සම්මා සම්බුදු පියාණන් වහන්සේලාගේ අනන්ත ගුණයට ගෞරව උපහාර පූජාවක් වශයෙන්ද, ඒ වාගේම ඒ කරුණා මෛත්‍රී සසිල් ජලාශයන්ද නව ලෝකෝතර ශ්‍රී සද්ධර්ම රත්නය නමැති සදහම් අමා පානයන්ද ලොවට විද්‍යමාන කරමින් ගෙන එන මහා සංඝරත්නයට මේ සිසිල් පානයන්ගෙන් ප්‍රණීත පානයන්ගෙන් මහා උපහාර පූජාවක් මෙසේ පූජා කරමි, පූජා වේවා!

සාධු! සාධු! සාධු!

## අෂ්ඨ පාන ගිලන් පස පූජාව

නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

නිදන ගති ඇති සමිඳු අභියස සමිඳු හදෙ වැඩ සිටින්නේ
පුදන ගති ඇත සමිඳුනේ ඔබ ළඟයි දරු ලෙස සිටින්නේ
හිතන හිත ඇත උතුම් සමිඳුනි ඔබයි සසුනයි පෙනෙන්නේ
ගතට සිත ඇත සමිඳුනේ මම සිසිල පවණයි දෙවන්නේ

නගන ගුණ නැණ සමිඳුනේ අද උතුම් පිය නෙත විලසිනා
සදන ගුණ දෙන සමිඳුනේ සමවතිනි ගෙන අද සැම දෙනා
සිතින සැනසෙන දහම මග නැණ දෙවන අයුරිනි සනහනා
පිනෙහි හොබවන ගතිය ගනිමින සිටිමි සමිඳුනි දැන දැනා

සැනසුම රැගෙන බුදු රජිඳුනි පසුම වන
දරුවන් විලස සිහි කළ මැන මෙබඳු දින
ගරු බුදු රජාණෙනි සැම සත මෙහිම ගෙන
පැමිණෙමි උතුම් මහ පූජා ගමන දැන

සැනසෙන සිතට සමිඳුනි පවනකි දෙන්නේ
ගරු ගුණ මහඟුමය සමිඳුනි අදහන්නේ
සැම ලෝ සතට භය දුක් ගිනි හැරලන්නේ
එම සූවිසි ගුණෙනි සමිඳුනි මග ගන්නේ

තුන් ලෝ දිනූ බුදු රජවරු මෙබඳු දිනේ
හද මඩලකට වැඩමා ඇත ගුණය කිනේ
අටවිසි බුදු රුවිනි දැනගෙන වැඳපු තැනේ
අද අපි කරමු පූජා මෙම විලසකි නේ

කරුණා මෙත් සිසිල ලෝ සත වෙත දුන්න
සම්දුනි කරම් පූජා පැන් ගනි මින්න
මෙම තැන් සිසිල් පැන් මහ ගුණයෙනි මෙන්න
එම ගුණ කඳට පූජා කරනෙමි දන්න

**සුගන්ධං සීතලං කප්පං - පසන්න මධුරං සුභං**
**පානීය මේතං භගවා - පතිගණ්හාතු මුත්තමං ///**

තුන් ලෝ දිනූ අටවිසි මහ මුණිඳුන්නේ
මහ ගුණ රුව මවා හද මැදුරෙහි වන්නේ
එම බුදු පියවරුන් වෙත අද බැතියෙන්නේ
අට විද පාන ගුණ දැක පූජා දෙන්නේ

**අධිවාසේතු නෝ භන්තේ - අට්ඨපානං පරි කප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං ///**

සාධු! සාධු! සාධු!

## ආයුෂ, වර්ණ, සැප, බල, පටිභාන ඥාණය ගෙන දෙන භෝජන පූජාව

ආයුෂ, වර්ණ, සැප, බල, පටිභාන ඥානය යන කරුණු කැටි කළා වන් මහා භෝජන පූජාවන් සම්මා සම්බුදුපියාණන් වහන්සේලා අග්‍රකර මහා සංඝරත්නයේ ජීවමාන අනන්ත ගුණයන්ට ගෞරව උපහාර වශයෙන් පූජා කරමි. පූජා වේවා!

**අධිවාසේතු නෝ භන්තේ - භෝජනං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**

සාධු! සාධු! සාධු!

## පළතුරු / කැවිලි / අවුල්පත් / කිරි පැණි ආදිය පූජා කිරීම

සම්මා සම්බුදු පියාණන් වහන්සේලා අග්‍රකර මහා සංඝ රත්නයට සියලු ආකාරයෙන් පූර්ණ වූ උපනාමික පූජාවක් මෙසේ පූජා කරමි. පූජා වේවා!

**අධිවාසේතු නෝ භන්තේ - භෝජනං උපනාමිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං**

සාධු! සාධු! සාධු!

## ඖෂධීය සුගන්ධවත් දැහැත් පූජාව

අප්‍රමාණ ශ්‍රී මුඛ සුගන්ධවත් දහම් වදන්, ගුණ වදන් ලොවට විද්‍යාමාන කර විහිදුවා වදාළා වූ සම්මා සම්බුදු පියාණන් වහන්සේලාගේ අප්‍රමාණ ශ්‍රී මුඛ සුගන්ධ ගුණයට ගෞරව උපහාර පූජාවක් වශයෙන් ද, ඒවාගේම ඒ සුගන්ධවත් දහම් වදන්, ගුණ වදන් ලොවට විද්‍යාමාන කරමින් ගෙන එන මහා සංඝ රත්නයේ අප්‍රමාණ මුඛ සුගන්ධ ගුණයට ගෞරව උපහාර පූජාවක් වශයෙන් ද සම්මා සම්බුදු පියාණන් වහන්සේලා අග්‍ර කර මහා සංඝ රත්නයට මේ ඖෂධීය සුගන්ධවත් දැහැත් පූජාවන්ගෙන් මහා උපහාර පූජාවක් පූජා කරමි පූජා වේවා!

අනත මුඛ සුවඳ ගුණ ලෝකෙට දෙන්නේ
එයිනි දම් සුවඳ අද ලොව පැතිරෙන්නේ
අනත ගුණ මුඛයේ එම සුවඳට දන්නේ
වදිමි මෙම දැහැත් ගෙන පූජා දෙන්නේ

සුවඳ වන් මෙවන් දැහැතින් සදන ලද
මෙවන් එම උතුම් දැහැතක් මෙලෙස වැඳ
එවන් අට විසි වූ මුනිඳුගෙ මුඛ සුවඳ
සිහි කර කරමි පූජා හද බැතිනි සොඳ

**නාගවල්ලී දලූපේතං - චුන්න පූග සමායුතං**
**තාම්බූලං පතිගණ්හාතු - සතං පූජේමි දං ජිනෝ ///**

අනත සෙත් ගුණ බලෙන් සමිඳුනි ඔබගෙ මහ ගුණ කියන්නේ
මෙලොව සෙත සැදූ මහා දම් ඖෂධයි දැක සිහි කරන්නේ
මහා ගුණ ඖෂදෙනි සමිඳුනි රෝග දුක් දුරු කෙරෙන්නේ
මහා බව දුක් හරින මග ඖෂධ දෙව් ගුණ වදින්නේ

මෙදා අට විසි මුණිඳු ගුණ දැක මහා ඖෂධ පුදනවා
සදා ගුණ සෙත් බලෙන් සමිඳුනි මෙවන් ගාථා නගනවා
සදා බුදු මහ ඖෂධේ ගුණ සියල් ලෙඩ රෝ හරිනවා
මෙදා වඳිනෙමි පුදමි ගාථා හඬින් ඖෂධ පුදනවා

**අධිවාසේතු නෝ භන්තේ - භේසජ්ජං පරි කප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං ///**

සාධු! සාධු! සාධු!

## අට පිරිකර පූජාව

ආර්ය අෂ්ඨාංගික මාර්ගය නමැති නව ලොකෝත්තර ශ්‍රී සද්ධර්ම රත්නයේ ගුණයට ගෞරව උපහාර පූජාවක් වශයෙන් සම්මා සම්බුදු පියාණන් වහන්සේලා අග්‍ර කර මහා සංඝරත්නයට මේ මහා අටපිරිකර පූජාවන්ගෙන් අග්‍ර මහා පූජාවක් පූජා කරමි. පූජා වේවා!

**අධිවාසේතු නෝ භන්තේ - අට්ඨ පරික්කාරං පරිකප්පිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං ///**

සාධු! සාධු! සාධු!

## මෙතෙක් නොකලා වූ සියලූ දේ එකවර පූජා කිරීම

**අධිවාසේතු නෝ භන්තේ - සබ්බං සද්ධාය පූජිතං**
**අනුකම්පං උපාදාය - පතිගණ්හාතු මුත්තමං ///**

සාධු! සාධු! සාධු!

## සීල ගුණය වඩන මල් පූජාව

සීල වර්ණයෙන් ද, සීල සුගන්ධයෙන් ද, සීල ගුණයෙන්ද යුක්තව රාග, ද්වේශ, මෝහ යන අකුසල් හෙවත් පහත් දේවල් සුන් කර දැමූ චිත්ත සන්තානයෙන් බුදු පියාණන් වහන්සේගේ ශ්‍රී පාද නමැති සීල ස්කන්ධය සරසමි. පංච කාමය නමැති මල් පා පෑගෙන දූවිල්ලක් සේ ඔබ වහන්සේ පා මුල දමමි.

| | |
|---|---|
| අසිරිමත් බුදු ගුණය ඇති රුව අපේ හදවත් | වෙතින්නේ |
| එඅට විසි මල් වලින් පූජා කරයි ඒ හද | මැවෙන්නේ |
| මෙ වැඩ හිඳ බුදු රජවරුනි ඔබෙ මහා මල් ගුණ | සිතන්නේ |
| සියලු පිරිසිඳු සියලු හැඟුමන් පිවිතුරුයි මල් | ලෙසින්නේ |
| එබඳු ගුණයට මෙවන් මල් ගෙන පුදමි මහ බුදු | රජිඳුනේ |
| එඅට විසි ගුණ රුවින් හදවතෙ වැඩම වූ මුණි | රජිඳුනේ |
| මෙවන් මල් ගෙන සිතින් සකසා ඔබට පූජා දෙමි | දිනේ |
| උතුම් බුදු රජවරුන් වෙත අද පුදමි මල් ගෙන සතු | ටිනේ |

**වණ්ණ ගන්ධ ගුණෝපේතං - ඒතං කුසුම සන්තතිං**
**පූජයාමී මුනින්දස්ස - සිරීපාද සරෝරුහේ ///**

සාධු! සාධු! සාධු!

(කු+සුම් = කුසුම්. "කු" යනු දස අකුලයයි. "සුං" යනු සුංකර දැමූ අදහසයි)

ලස්සන සුවඳ මුදු පහස සුවය දෙන ඒ මල් කඩා දැමීමෙන් බිඟු පහස නොලැබ මල් සහ ගස් වැල් පරපුරක් හට ගැනීමට ඇති හේතු නැති වන්නා සේ සිත, කය, වදන සංවර කර ගැනීමෙන් කාම භවයක් හට ගැනීමට ඇති හේතු නැතිවී යාමෙන් ද, මේ මල් මැලවී යන්නා සේ මේ ශරීරය ද විනාශ වී යන්නේය යන විදර්ශනා ඥානය පහළ කර ගැනීමෙන්ද කරනු ලබන මේ මල් පූජාවෙන් ලැබෙන්නා වූ පිනෙන් මට නිවන් සුව අත් වේවා.

**පූජේමි බුද්ධං කුසුමේනනේන**
**පුඤ්ඤේන මේතේන ලභාමි මොක්ඛං**
**පුප්ඵං මිලායාති යථා ඉදම්මේ**
**කායෝ තථායාති විනාස භාවං ///**

සාධු! සාධු! සාධු!

# සමාධිය වඩන හඳුන්කූරු පූජාව

සුචරිත ගුණයෙන් අවංක වූද, දහම් සුවඳින් සුවඳවත් වූ ද, දම් ගුණ සුවඳ විහිදෙන්නා වූ ද, අවිද්‍යා තණ්හා සහගත සිතුවිලි, ක්‍රියා, වදන් අළු බවට පත් කරමින් භව ගමන කෙටි වන අයුරු දකිමින් ලෝභ, ද්වේශ, මෝහ ගිනි නිවී යමින් සිත සමාධි ගතව නිවනේ ශාන්තිය ප්‍රත්‍යක්ෂ කර ගැනීමට උපමා කර පෙන්වූ මේ හඳුන්කූරු පූජාවෙන් තථාගතයන් වහන්සේ වෙත ප්‍රතිපත්තියෙන් පූජා කරමි.

අනත ගුණ සුවඳ දම් සුවඳ සහ නැගෙනවා
අනත ලොව පටන් දම් සුවඳ විහිදවනවා
අනත දම් සුවඳ සිහි කර මුනිඳු පුදනවා
අනත එම සුවඳ දැක සුවඳ හද නගිනවා

එ අට විසි මුනි රජුනි අප හද මැදුරේ වසන්නේ
ඔබෙ ගුණ වතට අද පිපුණ මල් තිබෙන්නේ
වඩා අද හිඳුවමින සුදු මලෙකි මෙතැන්නේ
සැදූ ආසන හදෙහි තිබේ ගුණ බලෙන්නේ

සම්බුදුනේ එබඳු ගුණ සුවය දැක අද දිනා
එ අට විසි මුනි රජුන් ගුණය සිහි කර මිනා
පුදමි මෙම සඳුන් සුනු සුවඳ දුම් තබ මිනා
මෙවන් ගාථා වකින් කරමි පූජා දැනා

**සුගන්ධිකාය වදනං - අනන්ත ගුණ ගන්ධිනා**
**සුගන්ධිනාහං ගන්ධේන - පූජයාමි තථාගතං ///**

සාධු! සාධු! සාධු!

# ප්‍රඥාව වඩන පහන් ආලෝක පූජාව

කර්ම ශක්තිය නමැති තෙල් ඇති තාක් දැල්වෙන ජීවිතය නමැති පහන් දැල්ල, අඛණ්ඩ හේතු ඵල ක්‍රියාවලියක ප්‍රතිඵලයක් මිස සත්‍ය වශයෙන් නොපවතින මායා දර්ශනයක් වන්නා සේ, දහම් නොදැන මමය මාගේය යන ආත්ම දෘෂ්ටියෙන් අල්ලා ගත් ඒ අවිද්‍යා අන්ධකාරය, කපුරු මිශ්‍ර තෙලෙන් හටගන්නා වූ පහන් ආලෝකයෙන් එළිය කරන්නා සේ තුන් ලෝකයම විද්‍යා ලෝකයෙන් දීප්තිමත් කළා වූ සම්මා සම්බුදු පියාණන් වහන්සේට මම මේ ප්‍රඥා ආලෝකයෙන් පූජා කරමි.

අසම සම ගුණ එ අට විසි බුදු ගුණ සිහි කරන්නේ
මහඟු නැණ බල එළිය අනතව සක්වලේ සැම නැගෙන්නේ
එහිරු දහසක් නැගුන තැන මුදු එළිය සලකුණු කරන්නේ
බැරිය මොහඳුරු නසන්නට එම නමුදු බුදු බල තිබෙන්නේ

මුණිඳු සතු නැණ එළිය ලෝ සත වෙත දි මොහඳුරු හරිනවා
මුණිඳු ගුණ නැණ එළිය සැම තැන් අවිදු පටලද නසනවා
දහම් මග නැණ එළිය මතු කර සතුන් වෙත එහි හැදෙනවා
එවන් එළි බිහි කරපු අට විසි මුණිඳු හදවතෙ සිටිනවා

එබඳු මුණි රජවරුනි ඔබෙ මහ එළිය වෙත ගෙන පුදන්නේ
දොළොස් මස දැල්වෙනා එළි ඇති පහන් වැට සහ මෙතැන්නේ
තැබූ මෙම සැම උතුම් එළි කඳ මුනිඳු ගුණ දැක බැතින්නේ
මෙවන් ගාථා කියා පූජා කරමි සමිඳුනි ඉතින්නේ

**ඝන සාරප්ප දිත්තේන - දීපේන තමද්ධංසිනා**
**තිලෝක දීපං සම්බුද්ධං - පූජයාමි තමෝනුදං ///**

සාධු! සාධු! සාධු!

පහන් පූජා කිරීමෙන් පසු චන්ද්‍ර සූර්ය දෙවියන්ට පින් අනුමෝදන් කර ඒ අයගෙන් ලොවට යහපත ඉල්ලා සිටීම.

**හිරුනේ සඳුනේ මේ පින් අරගෙන ලොවට සෙතක් ඔබ ගෙනදේවා**
**අපමණ ගුණ ඇති සම්බුදු රජිඳුට මේ පින් ආලෝකය වේවා**
**මේ පින් අරගෙන ලොව සෙත කරමින් සාන්ත සුවයම පතුරාවා**
**තෙරුවන් ගුණ කඳ අපමණ ලොව තුළ පහන් එළිය මෙන් බබලාවා**

සාධු! සාධු! සාධු!

## චෛත්‍ය වන්දනාව

සම්බුදු පියාණන් වහන්සේගේ සහ මහ රහතුන් වහන්සේලාගේ අනන්ත අප්‍රමාණ ගුණ සිහි කිරීම සඳහා උන්වහන්සේලාගේ ශාරීරික ධාතූන් වහන්සේලා නිධන් කර සියලූ චෛත්‍ය එකවර වන්දනා කරමි.

නමෝ බුද්ධ දිවාකරාය
නමෝ නමෝ ගෝතම චන්දිමාය
නමෝ නමෝ නන්ත ගුණන්නවාය
නමෝ නමෝ ශාක්‍ය නන්දනාය

බ්‍රහ්මින්ද දේවින්ද නරින්ද රාජං
බෝධිං සුබෝධිං කරුණා ගුනග්ගං
පඤ්ඤාපදීප ජලිතං ජලන්තං
වන්දාමි බුද්ධං භවපාර තිණ්ණං

නමෝ නමෝ සාක්‍ය කුලද්ද ජාය
නමෝ නමෝ සජ්ජන මාද ජාය
නමෝ නමෝ නිබ්බුති නිජ්ජරාය
නමෝ නමෝ ලෝක පහන් කරාය

**වන්දාමි චේතියං සබ්බං - සබ්බඨානේ සුපතිට්ඨිතං**
**සාරීරික ධාතු මහා බෝධිං - බුද්ධ රූපං සකලං සදා**

සාධු! සාධු! සාධු!

# ජය සිරි මහ බෝ සමිඳුන් වන්දනා කිරීම

උත්තරීතර ලොව්තුරා බුද්ධ රාජ්‍ය පහළ කිරීම සඳහා මහා උපනිශ්‍රය සම්පත් ගෙන දුන්නා වූද, මහා සෙවණක් ගෙන දුන්නා වූ බුදු පියාණන් වහන්සේගේ අනන්ත පාරමිතා බලයෙන් ලොව පහළ වූද, ලෝක සත්වයින්ගේ පූජා ලබන්නා වූද, ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ මම වන්දනා කරමි.

සම්බුදු රජවරු සඟ පෙළ සමගින - මැව්වෙමු සැමගෙම හද මැදුරට දැන
මෙලෙසින පිදුවෙමු බුදු සඟ පෙළ දැන - ගුණ සිහි කරනෙමු බෝසත් කරවන

සාරා සැකි අට සැකි සොළසින්නේ - කප් ගණනින් සසරෙහිද නැගෙන්නේ
පිරු මහ පෙරුමන් ගුණ කඳ ගන්නේ - සමතිංසත් පාරමි සපුරන්නේ

සිහි කර එම මහ ගුණ කඳ මෙදිනා - වඳිමු පුදමු බෝසත් ගුණ සොඳිනා
එම ගුණයෙන් සහජාතව නැගුනා - එම ජය සිරි බෝ රජ ළඟ ලෙසිනා

සම්බුදු රජවරුනගෙ ගුණ දන්නා - කප් ගණනින් පෙරුමන් පුරමින්නා
සෙත් ගෙන දෙන බෝ රජහට ගන්නා - එම ගුණ සිහි කර බෝ නමදින්නා

බුදු රජ වෙනුවට ලොව වැඩ ඉන්නේ - එම ජය සිරි බෝ රජවරු නුන්නේ
ගුණ සිහි කර අබියසට මවන්නේ - එම මහ බෝ රජවරුන් වඳින්නේ

අරගෙන මල් පහනින් සුවඳින් ගෙන - පිරු දිය කල එම ලෙස දැන පුදමින
කොඩි සේසත් ආදී සැම මවමින - සැමගෙ අතෙහි තබනෙමි බෝ පුදවන

බුදු රජවරු අණ දැන එලෙසින්නේ - දස මර සෙන් පරදන තැන ගන්නේ
මහ බල හැම සක්වල පතුරන්නේ - එම තැන දස මර සෙන් පැරදෙන්නේ

එමවන් මහ බල සෙත් මග දුන්නා - එම ගුණ කඳ ගරුවෙන්ම සිතන්නා
සැමතින් පූජා කරන ලෙසින්නා - පුදනෙමු ජය සිරි බෝධි රජුන්නා

අපමණ ගුණ සිහි කර ගෙන පුදලා - මහ බෝසත් පෙරුමන් ගුණ හිතලා
එම බල බුදු බල දෙක කැටි කරලා - රැකවරණය ලබනෙමු සැම සකලා

නිවන් දකින තුරු දුක් නොම වේවා - සැම රැකවරණය සැමට ලැබේවා
බාධක මාරක විපත් නොවේවා - මේ ලෙස ගාථා කියමු නැගේවා

ශාස්තෘන් වහන්සේ කිසියම් බෝධි මූලයක ඉඳ සියලූ ලෝක ධර්මතාවයන් යථාර්ථයෙන් දැක, ඒවා විජයග්‍රහණය කොට සර්වඥතා ඥානය අවබෝධ කර ගත්තේ ද, ඒ බෝධි පාදයට මම නමස්කාර කරමි.

**යස්ස මූලේ නිසින්නෝව**
**සබ්බාරි විජයං අකා**
**පත්තෝ සම්බඤ්ඤුතං සත්ථා**
**වන්දේතං බෝධි පාදපං**

ලෝකනාථ වූ බුදු පියාණන් වහන්සේගේ උපහාර පූජාවට පාත්‍ර වූ ඒ ශ්‍රේෂ්ඨ බෝධීන් වහන්සේට ඒ ආකාරයෙන්ම මමද නමස්කාර කරමි.

**ඉමේ ඒතේ මහා බෝධී**
**ලෝක නාථේන පූජිතා**
**අහංපි තේ නමස්සාමි**
**බෝධිරාජා නමත්ථු තේ**

මුනීන්ද්‍රයන් වහන්සේ ඒ බෝධි මුලයෙහි දී සියලු මාර බල පරාජය කොට ජය ලැබූ සේක. එයින් සතුටට පත් දේව සමූහයා මහත් සේ ජය ඝෝෂා කරන්නට වූහ. ඒ සත්‍ය බලයෙන් සැමට යහපතක්ම වේවා.

**ජයෝ මුනින්දස්ස සුබෝධි මූලේ**
**අහෝසි මාරස්ස පරාජයෝහී**
**උග්ඝෝසයුං දේව ගණා පසන්නා**
**ඒත්තේන සච්චේන සුවත්ථි හෝතු**

වේදය හෙවත් විද්‍යාවෙහි පරතෙරට පත් ඒ බුදු පියාණන් වහන්සේට කරන්නා වූ නමස්කාරය හේතුවෙන් මට රැකවරණයක් වේවා. ඒ බුද්ධත්වයට ද, බෝධියට ද, මම නමස්කාර කරමි. ඒ බුදුපියාණන් වහන්සේ පෙන්වා දුන් විමුක්ති මාර්ගයට අනුව මම කටයුතු කරමි.

**යේ බ්‍රාහ්මණා වේදගු සබ්බ ධම්මේ**
**තේ මේ නමෝ තේච මං පාලයන්තු**
**නමත්ථු බුද්ධානං නමත්ථු බෝධියා**
**නමෝ විමුත්තානං නමෝ විමුත්තියා**

සාධු! සාධු! සාධු!

## ජය සිරි මහ බෝ සමිඳුන් පිදූ පිනෙන් සෙත් ලබා ගැනීම

බුදු සෙත් බල ලෝකෙට මතු වේවා - බෝ රජවරුනට දියෙන් පිදේවා
සැම පූජා බෝ රජිඳුට වේවා - සැම දුකඳුර දුරු කර සෙත වේවා

මර සෙන් පරදන්නට බුදු වන තැන - රැකවරණය දෙන ලෙස මහ බලයෙන
සහජාතව පාරමී දම් බලයෙන - පහළ වූ බෝ රජ වඳිනෙමු සැම දෙන

බුදු බලයට අනු බලයක් දුන්නා - අපට ද එම ආසිරි හිමි වන්නා
තිලොවට ධජයක් ලෙස ලෙල දෙන්නා - කොඩි ගෙන ජය සිරි බෝධි පුදන්නා

මාරක බාධක සැම දුරු වේවා - අපල දෝස සහමුල දුරු වේවා
හිතුව පැතුව ජය සැමට ලැබේවා - නිවන දකින තුරු ජය සැලසේවා

රවි සඳු කුජ බුධ ගුරු සිකුරු ද යන - සනිද රාහු කේතු ද ලොව පවතින
ග්‍රහ දොස් සහ මුල පහකර සැමතින - රැකවරණය වේවා බෝ බලයෙන

අණ වින බන්ධන විස දුරු වේවා - බුදු බල බෝ බල මහිම ලැබේවා
සසර වසන තුරු සැනසුම වේවා - හිතන පතන ජය සැමට ලැබේවා

වස විස බාධක අතුරු නොවේවා - වෛර ක්‍රෝධ තරහව දුරු වේවා

හතුරු බියක් කිසි විටෙක නොවේවා - බුදු බල බෝ බල ජය සෙත දේවා

සමගිය සාමය ලොව රජ වේවා - රජයට කිසි බාධක ද නොවේවා
මැති ඇමති ද සැමට ද සෙත වේවා - සාමදාන රජයක් බිහි වේවා

සතුරු විපත් මුළු රටට නොවේවා- විස ගිනි සැඩ ගිනි අවිද නිවේවා
සාම වදන් ලෝකෙට ජය දේවා - බුදු බල බෝ බල ජය සෙත දේවා

වැසි දිය නිසි ලෙස කලට වසීවා - වාත වේග නිසි ලෙසට හමාවා
ග්‍රහ තරු නිසි මග නිතර සිටීවා - බුදු බල බෝ බල ජය සෙත දේවා

කුරිරු රෝග විස රෝග නොවේවා - දරුණු වසංගත කිසිදු නොවේවා
සුචරිත සංවර ගති රජ වේවා - බුදු බල බෝ බල ජය සෙත දේවා

මව් පිය වැඩිහිටි සුචරිත වේවා - දූ දරු පොඩි දරු කීකරු වේවා
බුදු පුත් මහ ථෙර ගුණයට ඒවා - බුදු බල බෝ බල ජය සෙත දේවා

සක්විති රජයක් ලෙස සැකසේවා - සක් පුරයක් ලෙස ජය සෙත වේවා
සක් හඬ ලෙස බුදු නද පැතිරේවා - සත් බුදු අනුහසයෙන් සෙත වේවා

යක් භූ පිසසුන් වින නොකරාවා - දෙව් බඹ ආසිරි නෙතින් බලාවා
හිතු පැතු සම්පත් මෙතින් නැගේවා -අට විසි බුදු බලයෙන් සෙත වේවා

තිසරණ සරණින් සැම සෙත වේවා - තිසරණ සරණින් ගුණ සැකසේවා
තිසරණ සරණින් සුවපත් වේවා - තිසරණ සරණින් නිවන් දකීවා.

*සාධු ! සාධු !! සාධු !!!*

# අට විසි බුද්ධ වන්දනා කවි

අට විසි බුදු රජාණන් වහන්සේලා පිදීම, අට විසි බෝ සමිඳුන් වහන්සේලා පිදීම, සූවිසි විවරණ පිදීම

සාරා සැකි කප් සුවහස් පෙර දින - තණ්හංකර මහ බුදු රජ ඉපදින
රුක් අත්තන බෝධිය පින් බලයෙන - සහජාතව පහලව මහ සෙත දින

මේධංකර මහ බුදු රජ සොඳිනා - ලොව පහලව කප් රුක ලෙස දිලුනා
කැල නමැති බෝ රජ පැන නැගුනා - සිසිල ලබා වඳිනෙමු බැති සිතිනා

සරණංකර බුදු රජ ලොව බුදු වී - තිසරණ ගුණ බලයෙන් සත නැහැ වී
පුළිල නමැති බෝ රජිඳුන් මතු වී - මරුගෙ බලය බිඳ හැරියයි සෙත වී

දීපංකර බුදු රජ ලොව ජය ගෙන - සෙත දුනි සත නැණ එළියෙහි තබමින
පුළිල බෝධි සහජාතව නැගෙමින - මරුගෙ බලය පරදා සෙත ගෙන දින

අප බුදු රජිඳුන් බෝසත් කාලේ - සුමේධ තාපස විය ඒ කාලේ
පළවැනි විවරණ ලැබු එම කාලේ - වඳිමු පුදා එම ගුණ මල් මාලේ

කොණ්ඩඤ්ඤය යන බුදු රජ පෙර දින - බුදු වන කල සල් බෝ රජ මතු වින
විජිතාවී සක්විති රජ බව ගෙන - විවරණ ගති වඳිනෙමු ගුණ දැන ගෙන

මංගල යන බුදු රජ වැඩ උන්නා - නා බෝධිය පහලව සෙත දුන්නා
සුරුචි නමින් බමුණුව උපදින්නා - තෙවැනිව ගත් විවරණය වඳින්නා

සුමන මුනිඳු පෙර ලොව උපදින්නේ - නා බෝ රජ සෙවණේ බුදු වන්නේ
අතුල නමින් දෙව් රජව උපන්නේ - සිවු වන විවරණ ගති නමදින්නේ

රේවත බුදු රජ ඉන් පසු කලකින - නා බෝ රජ සෙවණේ දැන බුදු වින
අති දේවය බමුණුව අප බුදු නැණ - පස්වැනි විවරණ ගති වඳිනෙමු දැන

සෝභිත බුදු රජ එලෙසම පසු කල - නා බෝ රජ සෙවණේ ලැබි බුදු බල
සුජාත බමුණුව විවරණ මහ බල - සවැනිව ලැබුවා වඳිනෙමු පින් එල

අනෝමදස්සී බුදු රජිඳුන්නේ - කුඹුක් බෝධි සෙවණේ බුදු වන්නේ
යක්ස රාජ ලෙස විවරණ ගන්නේ - සත් වැනි විවරණ වඳිමු බැතින්නේ

පදුම මුනිඳු පසු කල බුදු වෙනවා - තොටිල්ල බෝ සෙවණේ ජය තනවා
අප බෝසත් සිහ රජ ලෙස වෙනවා - අට වන විවරණ ගති නමදිනවා

නාරද මුනිඳුන් පසු කල බුදු වින - මහ තොටිල්ල බෝ රජ පහලම වින
මහ තවුසෙක් ලෙස විවරණ හිමි වින - වඳිමු එවන් නව වැනි විවරණ පින

පදුමුත්තර බුදු රජිඳු උපන්නා - හොර බෝධිය සෙවණේ ජය ගන්නා
ජටිල නමැති ධනවතෙකු ලෙසින්නා - විවරණ ගති එම ගුණය වඳින්නා

සුමේධ බුදු රජ පසු කල උපනා - බක්මී බෝධිය සෙවණට ලැබුනා
උත්තර මානවකව විවරණිනා - ජය ගති වඳිනෙමු එම පින බැතිනා

සුජාත බුදු රජ ලොව බබළන්නේ - මහ උණ බෝධිය තෙද බල දුන්නේ

සක්විති රජ ලෙස බෝසතු නුන්නේ - ලැබු විවරණ වඳිනෙමු ජය වන්නේ

පියදස්සී බුදු රජ පෙර කල වින - රුක්මල් බෝධිය සෙවණට හිමි වින
කස්සප බමුණුව විවරණ ලැබගෙන - කෙලෙස් හරින් වඳීනෙමු නැණ ගුණයෙන

අත්තදස්සි මහ බුදු රජ උපනා - සපු බෝධිය බුදු ගුණ මග දෙවුනා
සුසීම බමුණුව අප බුදු රජුනා - තුදුසු මහා විවරණ ගෙන නැගුනා

ධම්මදස්සි බුදු රජිඳු උපන්නේ - බෝ රජ විය රත්කරව් නමින්නේ
සක් දෙව් රජ වී දිව මල් ගන්නේ - පුදා ලැබූ විවරණය වඳින්නේ

සිද්ධත්තය යන බුදු රජ පෙර කල - කිණිහිරි බෝ රජ ළඟ බුදු විය බල
මංගල තාපස වී බෝසත් කල - ලැබු විවරණයට වඳිනෙමු මහ බල

තිස්ස බුදුන් තුන් ලොව ජය ගත්තා - මොර බෝධිය පිළිසරණට ඇත්තා
සුජාත නම් තාපසයෙකි සත්තා - වඳිනෙමු ගත් විවරණ සෙත ඇත්තා

ඵුස්ස බුදුන් පෙර කල උපදින්නේ - නෙල්ලි බෝධි රජ එකල වැඩෙන්නේ
විජිතාවී රජ විවරණ ගන්නේ - වඳිමු මෙ බෝසත් ගුණ දකිමින්නේ

විපස්සි මහ බුදු රජ ලොව උපනා - පළොල් බෝධි මුල බුදු බව ලැබුනා
අතුල නමැති දෙව් නා රජ නමිනා - විවරණ ගති වඳිනෙමු ගුණ හැඳිනා

සිඛී මුනිඳු පෙර ලොව බබළන්නේ - ඇටඹ බෝධි බුදු බව ගෙන දෙන්නේ
නමින් අරින්දම ලෙස රජ වෙන්නේ - අප බෝසත් විසි විවරණ ගන්නේ

වෙස්සභූ නම් බුදු රජිඳු උපන්නේ - සල් බෝධිය බුදු මග ගෙන දුන්නේ
සුදසුන් රජ අප මුනිඳුම වෙන්නේ - විසි එක් වැනි විවරණය ලබන්නේ

කකුසඳ මුනිඳුන් ලොව උපදින්නේ - මහරි බෝධි රජ ලොවෙහි නැගෙන්නේ
ඛේම නමින් හිඳ විවරණ ගන්නේ - දෙවිසි මහා විවරණය වඳින්නේ

කෝණාගමනය මහ මුනි රජිඳුන - අත්තික්කා බෝ රජ ළඟ බුදු වින
පරුවත නම් රජ වී බෝසත් ගුණ - ලැබු මහ විවරණ වඳිනෙමු ගුණ දැන

කස්සප බුදු රජ ලොවෙහි උපන්නා - නුග මහ බෝ රජ ළඟ බුදු වන්නා
ජෝතිපාල මානවකව උන්නා - ලැබු සූ විසි විවරණය වඳින්නා

සූවිසි මහ විවරණ කඳ ලැබ ගෙන - ගෝතම යන ගුණ නමකින් බබළන
අප බුදු රජිඳුට ඇසතුය නමකින - බෝ රජ පහලව සෙත දුනි බුදු වන

මේ බුදු රජවරු අපමණ කාලේ - පාරමි දම් පිරුවා ලොව නැලේ
සමතිංසත් පාරමි ගුණ මාලේ - නමදිමු හැරලා කම් රස ජාලේ

බුදු වන තුරු සසරෙහි සැරි සරමින - සාරා සැකි අට සැකි සොල සැකි යන
කප් ලක්සද පෙරුමන් පිරු මහ පින - කෙල ලක්සය සපුරයි සක්වල දැන

මේ මහ පින් බල මතු කර එන්නේ - ඉන් සහජාතව බල නැග එන්නේ
ජය සිරි බෝ රජ එයිනි උපන්නේ - එනිසයි බෝ රජ වෙත බල එන්නේ

දස මර සෙන් ආවත් පරදිනවා - අපල දෝස දුකදුරු දුරලනවා
බුදු සවු පිරිසට බලය දෙවනවා - අපි එම බෝ බලයෙන් සැනසෙනවා

බුදු රජිඳුගෙ කීකරු දරු විලසින - අප බුදු මග සිටිනෙමු සැනසුම ගෙන
අපෙ හද බුදු මැදුරක් ලෙස තනමින - සුදු නෙළුමෙන් ආසන සැකසුවෙ ගෙන

අට විසි මහ බුදු රජුන් මැවේවා - හද මැදුරට සනසමින් වඩීවා
මැව් මල් අසුනෙහි වැඩම හිඳීවා - මහ සඟ පෙළ එම සමග වඩීවා

සාධු ! සාධු !! සාධු !!!

## අප්‍රමාණ බුද්ධ ශක්තියේ ආරක්ෂාවරණය ලබා ගැනීම

සම්බුදු සිරි හස්තය ගෙන මවනෙමි - සියලුම සක්වල විහිදා තබනෙමි
සියලුම සත හට වින දොස නසනෙමි - සම්බුදු මහ බල පතුරා හරිනෙමි

සියලුම සක්වල වට කර තිබෙනා - සම්බුදු ආසිරි බල සෙත් වරුණා
සියලුම සත හට විහිදා තැබුණා - සියලුම වින දොස දුරු කර හැරුණා

සම්බුදු ආසිරි බල විහිදේවා - මහ සිරි හස්තය සියලු මැවේවා
දස දහසක් සක්වල වට වේවා - සැම තැන ආසිරි බුදු රැස් වේවා

සවනක් ඝන මහ බුදු රැස් සිරසෙන - විහිදී පැතිරී සවනක් ඝන දෙන
මහ සත් ආසිරි බල මහිමය ගෙන - සක්වල ආරක්ෂාවරණය වේවා යන

අදිටන අරගෙන මුනි රජිඳුන්නේ - බල අදිටන ගෙන මෙලෙස තබන්නේ
සක්වල වට කර වින වනසන්නේ - සම්බුදු ආසිරි බල පිහිටන්නේ

සියලුම සක්වල වට කර විහිදෙන - දොසක් නොවන ලෙස මහ සත් බලයෙන
අද මේ අදිටන බුදු රැස් බලයෙන - තබනෙමි සියලුම සක්වල වටගෙන

සියලුම සැම දොස් දුරු කර යාවා - සම්බුදු ආසිරි බල පිහිටාවා
සූවිසි මහ ගුණ බල සිහි වේවා - සියලුම සක්වල වින වැනසේවා

සම්බුදු ආසිරි සත් බල අරගෙන - සියලුම සක්වල පිහිටා මෙලෙසින
සම්බුදු සදහම් මහ සඟ කියවන - සිරි සත් බල මහිමය ගෙන විහිදෙන

සියලුම සක්වල වට කර තිබෙනා - වින දොස් දුරු කර මේ සෙත් වරුණා
පිහිටා සියලුම ආරක්ෂාවරණයෙනා - සැමටම සෙත වේවා බුදු සරණා

සැම තැන සම්බුදු සරණය වේවා - අට විසි මුනි රජ බල පිහිටාවා
සක්වල වට කර බල සෙත වේවා - සැම දොස් දුරු කර සෙත සැලසේවා

සියලුම සක්වල අද සිට කිසි තැන - දස දහසක් සක්වල වට කර ගෙන
අණවින බන්ධන සුන් කර හරිමින - මේ සෙත තබනෙමි බුදු රැස් බලයෙන

සම්බුදු සිරි හස්තය ගෙන මැවිලා - විහිදී සියලුම සක්වල වටලා

මහ රැකවරණය වේවා කියලා - අදිටන් තබලා ඇත ලොව සකලා

සියලුම සත හට වින දුරු වේවා - අණවින බන්ධන සැම වැනසේවා
රැකවරණය බුදු සරණින් වේවා - ජයසිරි මහ බෝ රැකවරණේවා

මහ රැකවරණය විහිදී සැම තැන - අපමණ සක්වල විහිදෙන බුදු ගුණ
දස මර සෙන් පැරදුව බුදු බල ගෙන - විහිදා හරිනෙමි අද රැස් කරගෙන

සියලුම සක්වල වට විහිදේවා - මහ රැකවරණය මුනිඳු දෙවාවා
මුනිඳුගෙ බල ශක්තිය පිහිටාවා - රැකවරණයි සත සැමටම වේවා

# කරණීය මෙත්ත සූත්‍රය

කරණීයමත්ථකුසලේන
යං තං සන්තං පදං අභිසමෙච්ච
සක්කෝ උජූ ච සූජූ ච
සුවචෝ චස්ස මුදු අනතිමානී

සන්තුස්සකෝ ච සුභරෝච
අප්පකිච්චෝච සල්ලහුකවුත්ති
සන්තින්ද්‍රියෝ ච නිපකෝච
අප්පගබ්බෝ කුලේසු අනනුගිද්ධෝ

නච ඛුද්දං සමාචරේ කිඤ්චි
යේන විඤ්ඤූ පරේ උපවදෙය්‍යුං
සුඛිනෝ වා ඛේමිනෝ හොන්තු
සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

යේ කේචි පාණභූතත්ථි
තසා වා ථාවරා වා අනවසේසා
දීඝා වා යේ මහන්තා වා
මජ්ඣිමාරස්සකාණුකථූලා

දිට්ඨා වා යේවා අද්දිට්ඨා
යේ ච දූරේ වසන්ති අවිදූරේ
භූතා වා සම්භවේසී වා
සබ්බේ සත්තා භවන්තු සුඛිතත්තා

න පරෝ පරං නිකුබ්බේත
නාතිමඤ්ඤේත කත්ථචි නං කඤ්චි
බ්‍යාරෝසනා පටිඝසඤ්ඤා
නාඤ්ඤමඤ්ඤස්ස දුක්ඛමිච්ඡෙය්‍ය

මාතා යථා නියං පුත්තං
ආයුසා ඒකපුත්තමනුරක්ඛේ
ඒවම්පි සබ්බභූතේසු
මානසං භාවයේ අපරිමාණං

මෙත්තංච සබ්බ ලෝකස්මිං
මානසං භාවයේ අපරිමාණං
උද්ධං අධෝ ච තිරියඤ්ච
අසම්බාධං අවේරං අසපත්තං

තිට්ඨං චරං නිසින්නෝ වා
සයානෝවා යාවතස්ස විගතමිද්ධෝ
ඒතං සතිං අධිට්ඨෙය්‍ය
බ්‍රහ්මමේතං විහාරං ඉධමාහු

දිට්ඨිං ච අනුපගම්ම සීලවා
දස්සනේන සම්පන්නෝ
කාමේසු විනෙය්‍ය ගේධං
න හි ජාතු ගබ්භසෙය්‍යං පුනරේතීති

## මහා මංගල සූත්‍රය

ඒවං මේ සුතං ඒකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථ පිණ්ඩිකස්ස ආරාමේ, අථඛෝ අඤ්ඤතරා දේවතා අභික්කන්තාය රත්තියා අභික්කන්ත වණ්ණා කේවල කප්පං ජේතවනං ඕභාසෙත්වා යේන භගවා තේනුපසංකමි, උපසංකමිත්වා භගවන්තං අභිවාදෙත්වා ඒකමන්තං අට්ඨාසි. ඒකමන්තංඨිතා ඛෝ සා දේවතා භගවන්තං ගාථාය අජ්ඣභාසි.

බහූ දේවා මනුස්සා ච – මංගලානී අචින්තයුං
ආකංඛමානා සොත්ථානං – බෲහි මංගල මුත්තමං
අසේවනා ච බාලානං – පණ්ඩිතානඤ්ච සේවනා
පූජා ච පූජනීයානං – ඒතං මංගල මුත්තමං
පතිරූප දේස වාසෝ ච – පුබ්බේ ච කත පුඤ්ඤතා
අත්ත සම්මා පණීධි ච – ඒතං මංගල මුත්තමං
බාහු සච්චඤ්ච සිප්පඤ්ච – විනයෝ ච සුසික්ඛිතෝ
සුභාසිතා ච යා වාචා – ඒතං මංගල මුත්තමං
මාතාපිතූ උපට්ඨානං – පුත්තදාරස්ස සංගහෝ
අනාකුලා ච කම්මන්තා – ඒතං මංගල මුත්තමං
දානඤ්ච ධම්මචරියා ච – ඤාතකානඤ්ච සංගහෝ
අනවජ්ජානි කම්මානි – ඒතං මංගල මුත්තමං
ආරති විරති පාපා – මජ්ජපානා ච සංයමෝ
අප්පමාදෝ ච ධම්මේසු – ඒතං මංගල මුත්තමං
ගාරවෝ ච නිවාතෝ ච – සනතුට්ඨී ච කතඤ්ඤුතා
කාලේන ධම්මසවණං – ඒතං මංගල මුත්තමං
ඛන්තීච සෝවචස්සතා – සමණානඤ්ච දස්සනං
කාලේන ධම්මසාකච්ඡා – ඒතං මංගල මුත්තමං
තපෝ ච බ්‍රහ්මචරියඤ්ච – අරියසච්චාන දස්සනං
නිබ්බානසච්ඡිකිරියාච – ඒතං මංගල මුත්තමං
ඵුට්ඨස්ස ලෝකධම්මේහී – චිත්තං යස්ස න කම්පති
අසෝකං විරජං ඛේමං – ඒතං මංගල මුත්තමං
ඒතාදිසානි කත්වාන – සබ්බත්ථමපරාජිතා
සබ්බත්ථ සොත්ථිං ගච්ඡන්ති – තං තේසං මංගල මුත්තමන්ති.

## රතන සූත්‍රය

1. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වායා නිව අන්තලික්ඛෙ
සබ්බේව භූතා සුමනා භවන්තු
අථෝපි සක්කච්ච සුණන්තු භාසිතං

2. තස්මා හි භූතා නිසාමේථ සබ්බේ
මෙත්තං කරෝථ මානුසියා පජාය
දිවා ච රත්ථෝ ච හරන්ති යේ බලිං
තස්මා හි නේ රක්ඛථ අප්පමත්තා

3. යං කිඤ්චි විත්තං ඉධ වා හුරං වා
සග්ගේසු වා යං රතනං පණීතං
න නෝ සමං අත්ථි තථාගතේන
ඉදම්පි බුද්ධේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

4. ඛයං විරාගං අමතං පණීතං
යදජ්ඣගා සක්‍යමුනී සමාහිතෝ
න තේන ධම්මේන සමත්ථි කිඤ්චි
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

5. යං බුද්ධසෙට්ඨෝ පරිවණ්ණයී සුචිං
සමාධිමානන්තරිකඤ්ඤමාහු
සමාධිනා තේන සමෝ න විජ්ජති
ඉදම්පි ධම්මේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

6. යේ පුග්ගලා අට්ඨ සතං පසත්ථා
චත්තාරි ඒතානි යුගානි හොන්ති
තේ දක්ඛිණෙය්‍යා සුගතස්ස සාවකා
ඒතේසු දින්නානි මහප්ඵලානි
ඉධම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

7. යේ සුප්පයුත්තා මනසා දළ්හේන
නික්කාමිනෝ ගෝතමසාසනම්හි
තේ පත්තිපත්තා අමතං විගය්හ
ලද්ධා මුධා නිබ්බුතිං භුඤ්ජමානා
ඉදම්පි සංඝේ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

8. යථින්දඛීලෝ පඨවිංසිතෝසියා
චතුබ්භි වාතේභි අසම්පකම්පියෝ
තථූපමං සප්පුරිසං වදාමි

යෝ අරියසච්චානි අවෙච්ච පස්සති
ඉදම්පි සංඝෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

9. යේ අරිය සච්චානි විභාවයන්ති
ගම්භීරපඤ්ඤේන සුදේසිතානි
කිඤ්චාපි තේ හොන්ති භුසප්පමත්තා
න තේ භවං අට්ඨමං ආදියන්ති
ඉදම්පි සංඝෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

10. සහාවස්ස දස්සනසම්පදාය
තයස්සු ධම්මා ජහිතා භවන්ති
සක්කායදිට්ඨී විචිකිච්ඡිතඤ්ච
සීලබ්බතංවාපි යදත්ථි කිඤ්චි
චතූහපායේහි ච විප්පමුත්තෝ
ඡ චාභි ඨානානි අභබ්බෝකාතුං
ඉදම්පි සංඝෙ රතනං පණීතං

ඉදම්පි සංඝෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

11. කිඤ්චාපි සෝ කම්මං කරෝති පාපකං
කායේන වාචා උද චේතසා වා
අභබ්බෝ සෝ තස්ස පටිච්ඡාදාය
අභබ්බතා දිට්ඨපදස්ස වුත්තා
ඉදම්පි සංඝෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

12. වනප්පගුම්බේ යථාවුස්සිතග්ගේ
ගිම්හානමාසේ පඨමස්මිංගිම්හේ
තථූපමං ධම්මවරං අදේසයී
නිබ්බාණගාමිං පරමං හිතාය
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

13. වරෝ වරඤ්ඤූ වරදෝ වරාහරෝ
අනුත්තරෝ ධම්මවරං අදේසයී
ඉදම්පි බුද්ධෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

14. ඛීණං පුරාණං නවං නත්ථි සම්භවං
විරත්තචිත්තා ආයතිකේ භවස්මිං
තේ ඛීණබීජා අවිරුළ්හිඡන්දා
නිබ්බන්ති ධීරා යථායම්පදීපෝ
ඉදම්පි සංඝෙ රතනං පණීතං
ඒතේන සච්චේන සුවත්ථි හෝතු

15. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දේවමනුස්ස පූජිතං
බුද්ධං නමස්සාම සුවත්ථි හෝතු

16. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දේවමනුස්ස පූජිතං
ධම්මං නමස්සාම සුවත්ථි හෝතු

17. යානීධ භූතානි සමාගතානි
භුම්මානි වා යානිව අන්තලික්ඛේ
තථාගතං දේවමනුස්ස පූජිතං
සංඝං නමස්සාම සුවත්ථි හෝතු

## මෙත්තානිසංස සූත්‍රය

ඒවං මේ සුතං. ඒකං සමයං භගවා සාවත්ථියං විහරති ජේතවනේ අනාථපිණ්ඩිකස්ස ආරාමේ. තත්‍ර ඛෝ භගවා භික්ඛූ ආමන්තේසි භික්ඛවෝති, භදන්තේති තේ භික්ඛූ භගවතෝ පච්චස්සෝසුං' භගවා ඒතදවෝච.
මෙත්තාය භික්ඛවේ චේතෝවිමුත්තියා ආසේවිතාය භාවිතාය බහුලීකතාය යානීකතාය වත්ථු කතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය, ඒකාදසානිසංසා පාටිකංඛා. කතමෙ ඒකාදස?

1. සුඛං සුපති, 2. සුඛං පටිබුජ්ඣති, 3. න පාපකං සුපිනං පස්සති, 4. මනුස්සානං පියෝ හොති, 5. අමනුස්සානං පියෝ හොති, 6. දේවාතා රක්ඛන්ති, 7. නාස්ස අග්ගිවා විසං වා සත්ථං වා කමති, 8. තුවටං චිත්තං සමාධියති, 9. මුඛවණ්ණෝ විප්පසීදති, 10. අසම්මූළ්හො කාලං කරොති, 11. උත්තරිං අප්පටිවිජ්ඣනෙත්තා බ්‍රහ්මලොකූපගො හොති.

මෙත්තාය භික්ඛවේ චේතෝ විමුත්තියා, ආසේවිතාය භාවිතාය බහුලීකතාය, යානීකතාය වත්ථුකතාය අනුට්ඨිතාය පරිචිතාය සුසමාරද්ධාය. ඉමෙ ඒකාදසානිසංසා පාටිකංඛාති.

ඉදමවෝච භගවා. අත්තමනා තේ භික්ඛුභික්ඛූ භගවතෝ භාසිතං අභිනන්දුන්ති.

## ජය පිරිත

සිරි ධිති මති තේජෝ - ජයසිද්ධි මහිද්ධි මහා ගුණං
අපරිමිත පුඤ්ඤාධිකාරස්ස - සබ්බන්තරාය නිවාරණ සමත්ථස්ස
භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස

ද්වත්තිංස මහාපුරිසලක්ඛණානුභාවේන
අසීත්‍යානුබ්‍යඤ්ජන ලක්ඛණානුභාවේන
අට්ඨුත්තරසතමංගල ලක්ඛණානුභාවේන
ඡබ්බණ්ණ රන්ස්‍යානුභාවේන
කේතුමාලානුභාවේන
දස පාරමිතානුභාවේන
දස උප පාරමිතානුභාවේන
දස පරමත්ථ පාරමිතානුභාවේන

සීල සමාධි පඤ්ඤානුභාවේන
බුද්ධානුභාවේන ධම්මානුභාවේන සංඝානුභාවේන
තේජානුභාවේන ඉද්ධානුභාවේන බලානුභාවේන,
ඤෙය්‍යධම්මානුභාවේන
චතුරාසීතිසහස්ස ධම්මක්ඛන්ධානුභාවේන
නවලෝකෝත්තරධම්මානුභාවේන
අට්ඨංගිකමග්ගානුභාවේන
අට්ඨසමාපත්‍යානුභාවේන
ඡළභිඤ්ඤානුභාවේන
මෙත්තා කරුණා මුදිතා උපේක්ඛානුභාවේන
සබ්බපාරමිතානුභාවේන
රතනත්තය සරණානුභාවේන

තුය්හං සබ්බරෝග සෝක උපද්දවා දුක්ඛදොමනස්සුපායාසා විනස්සන්තු
සබ්බසංකප්පා තුය්හං සමිජ්ඣන්තු
දීඝායුකෝ හෝතු සතවස්සජීවේන සමංගිකෝ හෝතු සබ්බදා

ආකාස පබ්බත වනභූමි තටාක ගංගා මහාසමුද්ද
ආරක්ඛක දේවතා සදා තුම්හේ අනුරක්ඛන්තු
සබ්බ බුද්ධානුභාවේන සබ්බ ධම්මානු භාවේන සබ්බ සංඝානුභාවේන
බුද්ධරතනං ධම්මරතනං සංඝරතනං තින්නංරතනානං ආනුභාවේන
චතුරාසීති සහස්ස ධම්මඛන්ධානුභාවේන
පිටකත්තයානුභාවේන
ජිනසාවකානුභාවේන

සබ්බේ තේ රෝගා සබ්බේ තේ භයා සබ්බේ තේ අන්තරායා සබ්බේ තේ උපද්දවා සබ්බේ තේ දුන්නිමිත්තා සබ්බේ තේ අවමංගලා විනස්සන්තු

ආයුවඩ්ඪකෝ ධනවඩ්ඪකෝ සිරිවඩ්ඪකෝ යසවඩ්ඪකෝ බලවඩ්ඪකෝ වණ්ණවඩ්ඪකෝ සුඛවඩ්ඪකෝ හෝතු සබ්බදා

දුක්ඛ රොග භයාවේරා - සොකා සබ්බේ උපද්දවා
අනේකා අන්තරායාපි - විනස්සන්තුච තේජසා
ජයසිද්ධි ධනං ලාභං - සොත්ථි භාග්‍යං සුඛං බලං
සිරි ආයුච වණ්ණෝච - භොගං වුද්ධිච යසවා
සතවස්සෝච ආයුච - ජීවසිද්ධි භවන්තු තේ

# දස දිසා පිරිත

දිසාසු දස භාගේසු - ඨිතා බුද්ධානු භාවතෝ
වේරාපි අන්තරායාපි - විනස්සන්ති අසේසතෝ
ඒවමාදි ගුණෝපේතං - පරිත්තං තං භණාමහේ

පදුමුත්තරෝ පුරත්ථිමායං - අග්ගිම්හි චේව රේවතෝ
දක්ඛිනේ කස්සපෝ බුද්ධෝ - නේරුතේච සුමංගලෝ
පච්ඡිමේච සිඛී බුද්ධෝ - වායව්‍යා මේධංකරෝ
උත්තරේ පියදස්සීච - ඊසානේ දීපංකරෝ
පඨව්‍යා කකුසන්ධෝච - ආකාසේ සරණංකරෝ

ඒවං දස දිසාචේව - සබ්බේ බුද්ධා පතිට්ඨිතා
අච්චන්තරායා සබ්බේ මේ - සෝක රෝග භයාපිච
විනස්සන්තු සාදා මයිහං - සබ්බිරියා පථේසුච
යක්ඛාදි දේවතා භීච - රාජ චොරාරි අග්ගිභී
අමනුස්සේහි සබ්බේභී - තිරච්ඡාන ගතේහිච
ජාතා උපද්දවා සබ්බේ - විනස්සන්තු අසේසතෝ

සිරස්මිං මේ බුද්ධ සෙට්ඨයෝ - සාරිපුත්තෝච දක්ඛිනේ
වාමංසේ මොග්ගල්ලානෝ - මේ පුරතෝ පිටකත්තයං
පච්ඡිමේ මම ආනන්දෝ - චතුද්දිසා ඛීණාසවා
සමන්තා ලෝක පාලාච - ඉන්ද දේවෝච බ්‍රහ්මච
ඒතේසං ආනුභාවේන - සබ්බූපද්ද වූපද්දවා
අනේකා අන්තරායාපි - විනස්සන්තු අසේසතෝ

පරිත්තස්සානුභාවේන - සබ්බ රෝග විනස්සතු
සබ්බ භය විනස්සතු - සබ්බ වින විනස්සතු
සබ්බන්තරාය විනස්සතු - සබ්බාකාර වින හිර බන්ධන විනස්සතු

# මෝර පිරිත

උදේතයං චක්ඛුමා ඒකරාජා
හරිස්සවණ්ණෝ පඨවිප්පභාසෝ
තං තං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං
තයජ්ජ ගුත්තා විහරේමු දිවසං

යේ බ්‍රාහ්මණා වේදගු සබ්බධම්මේ
තේ මේ නමෝ තේච මං පාලයන්තු
නමත්ථු බුද්ධානං නමත්ථු බෝධියා
නමෝ විමුත්තානං නමෝ විමුත්තියා

ඉමං සෝ පරිත්තං කත්වා මෝරෝ චරති ඒ සනා
අපේතයං චක්ඛුමා ඒකරාජා
හරිස්සවණ්ණෝ පඨවිප්පභාසෝ
තං තං නමස්සාමි හරිස්සවණ්ණං පඨවිප්පභාසං
තයජ්ජ ගුත්තා විහරේමු රත්තිං

යේ බ්‍රහ්මණා වේදගු සබ්බධම්මේ
තේ මේ නමෝ තේ ච මං පාලයන්තු
නමත්ථු බුද්ධානං නමත්ථු බෝධියා
නමෝ විමුත්තානං නමෝ විමුත්තියා

ඉමං සෝ පරිත්තං කත්වා මෝරෝ වාසම කප්පයිති.

## භාවනා කිරීමට ප්‍රථම වැඩිය යුතු පූර්ව කෘත්‍ය

උතුම් වූ ආර්ය භාවනාවක් වැඩීමට යන මේ මෙහොතේ සියලු සක්වල වැඩ සිටිනා දෙවි දේවතාවුන් මේ දහම් ගෝචර වන සියලු සත්වයෝ අපත් සමඟ මේ කර්මස්ථානය වැඩීමට සම්බන්ධ වේවායි ආරාධනා කරමින් තුන් වතාවක් සාධුකාර දෙන්න සාධු ...... සාධු ...... සාධු ......

අනන්ත සංසාරයේ, මා පැමිණි ගමනේ, මාගේ සිත, කය, වචනය යන තුන් දොරින් බුද්ධ ධම්ම සංඝ යන තුණුරුවන්ටත්, ආර්යන් වහන්සේලාටත්, බුද්ධ සාසනයටත්, සියලු ලෝක සියලු සත්වයන්ටත්, මාගෙන් යම් අවැඩක්, අසාධාරණයක්, හිංගියක් හිංසාවක් සිදු වී නම්, ඒ සියලු වරදට බුදු සසුනෙන් මෙන්ම ඒ සියල්ලන්ගෙන්ම මට කමාව ලැබෙත්වා! කමාව ලැබෙත්වා! කමාව ලැබෙත්වා!

**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**
**නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස**

## භාවනා කිරීමට පෙර කියන ආශිර්වාද ගාථා

සම්බුද්ධේ අට්ඨ වීසංච - ද්වාදසංච සහස්සකේ
පංච සත සහස්සානී - නමාමි සිරසා දරං
තේසං ධම්මංච සංඝංච - ආදරේන නමාමහං
නමක්කාරානු භාවේන - සබ්බ භයා උපද්දවා
අනේකා අන්තරායාපී - විනස්සන්තු අසේසතෝ ///

යේ බ්‍රහ්මණා වේදගු සබ්බ ධම්මේ
තේ මේ නමෝ තේච මං පාලයන්තු
නමත්ථු බුද්ධානං නමත්ථු බෝධියා
නමෝ විමුත්තානං නමෝ විමුත්තියා ///

# ආර්ය මෛත්‍රී භාවනාව

පෙරදිග වසන සත්වයෝද - පෙර අනුදිග වසන සත්වයෝද
දකුණු දිග වසන සත්වයෝද - දකුණු අනු දිග වසන සත්වයෝද
පසුදිග වසන සත්වයෝද - පසු අනු දිග වසන සත්වයෝද
උතුරු දිග වසන සත්වයෝද - උතුරු අනු දිග වසන සත්වයෝද
යට දිග වසන සත්වයෝද - උඩ දිග වසන සත්වයෝද

මේ මම ද සියලු ලෝක සියලු සත්වයෝද
සංසාර දුකෙන් මිදෙත්වා - සංසාර රෝගයෙන් මිදෙත්වා
සංසාර භයෙන් මිදෙත්වා - සංසාර ගින්නෙන් මිදෙත්වා
සංසාර දාහයෙන් මිදෙත්වා - සංසාර ශෝකයෙන් මිදෙත්වා
සංසාර සයුරෙන් මිදෙත්වා - සංසාර කතරෙන් මිදෙත්වා
සංසාර අඳුරෙන් මිදෙත්වා
නිබ්බාන පරම සුඛයෙන් සුඛිත තර වෙත්වා ///

මමද සියලු ලෝක සියලු සත්වයෝද
සෝවාන් වෙත්වා - සකෘදාගාමි වෙත්වා
අනාගාමි වෙත්වා - අරිහත් වෙත්වා
දුකින් මිදෙත්වා
නිවන් දකිත්වා... නිවන් දකිත්වා... නිවන් දකිත්වා...

මමද සියලු ලෝක සියලු සත්වයෝද
සෝවාන් ඵලයෙන් නිදුක් වෙත්වා
සකෘදගාමි ඵලයෙන් නිරෝගි වෙත්වා
අනාගාමි ඵලයෙන් සුවපත් වෙත්වා
අරිහත් ඵලයෙන් දුකින් මිදෙත්වා
නිවන් දකිත්වා... නිවන් දකිත්වා... නිවන් දකිත්වා...

මාගේ ස්වාමී වූ බුදුරජාණන් වහන්ස ඔබ වහන්සේ කිසි කලෙක රහසින්වත් පව් නොකළ සේක. දෙවියන් සහිත ලෝකයාගේ අසහාය පූජාවන්ට භාජනය වූ සේක. මේ ආදී අනන්ත ගුණයන්ගෙන් යුක්ත වූ මහා කාරුණික වූ තිලෝගුරු අමා මෑණි සම්මා සම්බුදු පියාණන් වහන්සේට මම ජීවිතය පූජා කරමි. ඔබ වහන්සේ සරණ යමි. ආත්ම දමනය කළා වූ සියල්ලන් අතුරින් මුනින්ද්‍ර වූ ඔබ වහන්සේම අග්‍රය, ශ්‍රේෂ්ඨය, උත්තමය, ආත්ම පරිත්‍යාගය කළා වූ මහා ත්‍යාගීන් අතරෙන්ද ලොව ඇති තතු හරි හැටි දැන වදාල මහා ප්‍රාඥයින් අතරෙන්ද මාගේ ස්වාමී වූ බුදුපියාණන් වහන්සේම අග්‍රය, ශ්‍රේෂ්ඨය, උත්තමය. සියල්ලන්ටම සමාන කරුණාවක් ඇති, මහා කාරුණික බුදු පියාණන් වහන්සේ කරුණා ජලයෙන් තෙත් වූ ළයක් ඇති ඔබ වහන්සේගේ සිසිල් සෙවනෙහි ජීවත් වීමට මට ශක්තිය ලැබේවා. අප්‍රමාණ දුක් කරදර සතුටින් ඉවසීමට සමත් වූ ඔබ වහන්සේගේ ඒ ශාන්ති බලය මා සිත තුල ඇති වේවා. මා විසින් කරන ලද පින් රාශියම සිහි වේවා.

සීල, සමාධි, ප්‍රඥාවෙන් යුතුව මාගේ අවසාන චුති සිත ඇති වේවා. නිවන් දකින තුරා සංසාරයේ සැරිසරණතාක් මිත්‍යා දෘෂ්ටි කුලයක නූපදීවා, නිදුක් නිරෝගී කයක් ලැබේවා. කල්‍යාණ මිත්‍ර සම්පත්තිය ලැබේවා.

අප්‍රමාදව කුසල කර්ම වල යෙදී අනිච්ච, දුක්ඛ, අනන්ත මෙනෙහි කරමි. ජීවිතය අනිසියි, මරණයද අනිසියි. බුදු, පසේ, බුදු, රහත් උතුමෝද පිරිනිවන් පෑහ. එමෙන්ම මමද මරණයට පැමිණෙමි.

දෙතිස් මහා කුණු කයෙන්ද යුක්ත වූ මේ ශරීරය හාත්පසින්ම දුඹදය, අපිරිසිදුය, මාගේ ජීවිතයේ අනිච්ච භාවය මෙනෙහි කර විදර්ශනා වඩා සසරින් එතෙර වීමට මට ශක්තිය ලැබේවා.

පිරිසිදු සිතින් හා ගෞරවයෙන් කරන මාගේ මේ කුසලය මටම පිහිට වේවා. මම සත්‍ය අවබෝධ කරමි. අන් සියලූ දෙනාටද හැකි පරිදි සත්‍යය අවබෝධ කර වන්නෙමි. මා හා මාගේ ප්‍රිය සත්වයෝද සුවපත් වෙත්වා, දුකින් මිදෙත්වා, මාගේ ආරක්ෂක දෙවියෝද මේ ස්ථානයට අරක් ගත් දෙවියෝද බ්‍රහ්මයෝද, සුවපත් වෙත්වා, ආර්යයෝද, අනාර්යයෝද, අමනුෂ්‍යයෝද, යටින් අවීචියේ පටන් උඩින් භවාග්‍රය දක්වා දස දිසාවල සිටින සත්ව සමූහයාද සෝවාන් ඵලයෙන් නිදුක් වෙත්වා, සකෘදාගාමී ඵලයෙන් නීරෝගි වෙත්වා, අනාගාමී ඵලයෙන් සුවපත් වෙත්වා, අරිහත් ඵලයෙන් දුකින් මිදෙත්වා! ශෝකයට පත් සත්වයෝද ශෝකයෙන් මිදෙත්වා! බුද්ධ රත්නයේ ගුණ ප්‍රමාණයක් නැත! ධර්ම රත්නයේ ගුණ ප්‍රමාණයක් නැත! සංඝ රත්නයේ ගුණ ප්‍රමාණයක් නැත!

මේ අනන්ත අප්‍රමාණ වූ මහා ගුණ ඇත්තා වූ මේ උතුම් ත්‍රිවිධ රත්නයට මාගේ නමස්කාරය වේවා. මා තුල වෛරය නැති වේවා. තරහා නැති වේවා. දුක නැති වේවා. භයින් හා විපතින් මම මිදෙත්වා. මම දුකින් තොර වූ සිතක් ඇති වූවෙක් වේවා. අනුන්ගේ දුක දැක උනුවන හදවතක් මට ඇති වේවා. ඒ දුක නැතිකිරීමට හා දුකට පිහිට වීමට මට ශක්තිය ලැබෙත්වා. කරුණා ගුණය මා තුල ඉතිරී පැතිරේවා. නිහතමානී ගුණය දියුණු, තියුණු වේවා. මාගේ දුක් කරදර වලට එකම සැනසීම ඔබ වහන්සේ දෙසා වදාළ අසූහාර දහසක් ධර්මස්කන්ධයයි. ඒ නෛර්‍යාණික වූ ශ්‍රී සද්ධර්මයද ඒ ධර්මය වූ පරිද්දෙන් පිළිපදින්නා වූ ආර්ය සංඝ රත්නයද ජීවිතාන්තය දක්වා මම සරණ යමි. මාගේ ස්වාමී වූ භාග්‍යවත් බුදු පියාණන් වහන්සේට මාගේ ජීවිතය පූජා කරමි. පූජා වේවා!!! පූජා වේවා!!! පූජාම වේවා!!! දීපංකර ආදී සූවිසි බුදු පියාණන් වහන්සේලාට ද මාගේ නමස්කාරය වේවා. මා ඇති දැඩි කළ මාගේ දෙමාපියන්ටද, ගුරුවරුන්ටද මාගේ නමස්කාරය වේවා.

මේ සියළු පින් දෙවියන් සහිත ලෝකයාටද නැසී ගිය ඥාති මිත්‍රාදීන්ටද හිතවත්, අහිතවත් සියළු දෙනාට ද අයිති වේවා. මට සහ අප සැම දෙනාටම ප්‍රඥාව සහ ධර්මාවබෝධය ලැබීමෙන් පරම රමණීය වූ උතුම් ලෝකෝත්තර නිවන් සුව ලැබේවා. ත්‍රිවිධ රත්නය මට සමා වන සේක්වා.

සාධු! සාධු! සාධු!

## සත් බුද්ධ නමස්කාරය

විපස්සිස්ස නමත්ථු - චක්ඛු මන්තස්ස සිරිමතෝ
සිඛිස්ස පී නමත්ථු - සබ්බ භූතානු කම්පිනෝ
වෙස්සභුස්ස නමත්ථු - නහාථකස්ස තපස්සිනෝ
නමත්ථු කකුසන්දස්ස - මාරසේනා පමද්දිනෝ
කෝණාගමනස්ස නමත්ථු - බ්‍රාහ්මණස්ස වුසීමතෝ
කස්සපස්ස නමත්ථු - විප්පමුත්තස්ස සබ්බධී
අංගීරසස්ස නමත්ථු - සක්‍ය පුත්තස්ස සිරීමතෝ
යෝ ඉමං ධම්මමදේසේසී - සබ්බ දුක්ඛා පනූධනං
යේ චාපි නිබ්බුතා ලෝකේ - යථා භූතං විපස්සිසුං
තේජනා අපිසුණා - මහන්තා වීත සාරදා
හිතං දේව මනුස්සානං - යං නමස්සන්ති ගෝතමං
විජ්ජාචරණ සම්පන්නං - මහන්තං වීත සාරදං

## කර්මස්ථානය

රාග ගිනි මගෙ නිවේවා
ද්වේශ ගිනි මගෙ නිවේවා
මෝහ ගිනි මගෙ නිවේවා
සියලු ගිනි මගෙ නිවේවා

ලෝසත සැමගෙ රාගයේ ගිනි නිවේවා
ලෝසත සැමගෙ ද්වේශයේ ගිනි නිවේවා
ලෝසත සැමගෙ මෝහයේ ගිනි නිවේවා
ලෝසත සැමගෙ සැම දුක් ගිනි නිවේවා

සෝතාපන්න ඵලයෙන් සැම ගිනි නිවේවා
සකෘදාගාමී ඵලයෙන් සැම ගිනි නිවේවා
අනාගාමී ඵලයෙන් සැම ගිනි නිවේවා
අරිහත් ඵල ලබා මහා ජය ලබාවා

සාදු! සාදු! සාදු!

## නව ගුණ ශාන්තිය

ඉතිපි/ සෝ භගවා/ අරහං/ සම්මා සම්බුද්ධෝ/ විජ්ජාචරණ සම්පන්නෝ/ සුගතෝ/ ලෝකවිදූ/ අනුත්තරෝ පුරිස දම්ම සාරති / සත්තා දේව මනුස්සානං/ බුද්ධෝ/ භගවාති

ස්වාක්ඛාතෝ භගවතා ධම්මෝ/ සන්දිට්ඨිකෝ/ අකාලිකෝ/ ඒහිපස්සිකෝ/ ඕපනයිකෝ/ පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහීති

සුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ/ උජුපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ/ ඤායපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ/ සාමීචිපටිපන්නෝ භගවතෝ සාවක සංඝෝ/ යදිදංචත්තාරි පුරිසයුගානි අට්ඨ පුරිස පුග්ගලා/ ඒස භගවතෝ සාවක සංඝෝ/ ආහුණෙයියෝ/ පාහුණෙයියෝ/ දක්ඛිණෙයියෝ/ අඤ්ජලිකරණීයෝ/ අනුත්තරං පුඤ්ඤක්ඛෙත්තං ලෝකස්සා ති.

සාදු! සාදු!! සාදු!!!

| | | |
|---|---|---|
| 01. | කෙලෙසුන් මුලසුන් නැසුමෙන් | බෝවා |
| | සම්බුදු හිමියන් අරහත් | වූවා |
| | රිවිකැන් මෙන් පින් සිතුවිලි | වේවා |
| | රිවිගෙන් වන උවදුරු නැති | වේවා |
| 02. | මුදු මෙත් ගුණයෙන් සිවුසස් | පෙන්වා |
| | බුදු හිමි තිලොවට සම්බුදු | වූවා |

| | | |
|---|---|---|
| | සඳුගේ රැස් මෙන් මෙත් සිත් | වේවා |
| | සඳුගෙන් වන උවදුරු දුරු | වේවා |
| 03. | නැණ අවියෙන් නොදැනුම යට | ගන්වා |
| | හිමියන් විදූ සරණින් යුතු | වූවා |
| | අඟහරුගෙන් සෙසු සත නොපෙ | ළේවා |
| | අඟහරුගෙන් උවදුරු නොම | වේවා |
| 04. | වැඩියෙන් හොඳ මඟ කෙලෙසුන් | අරවා |
| | මුනිඳුන් සුගතැයි නම් ඇති | වූවා |
| | බුධ මෙන් නැණ නුවනින් දැල් | වේවා |
| | බුධගෙන් වන උවදුරු දුරු | වේවා |
| 05. | ඇති සැටියෙන් ලෝකයෙ තතු | දුටුවා |
| | බුදු හිමියන් ලෝ විදූ නම් | වූවා |
| | ගුරු මෙන් බර ගති ගුණ ඇති | වේවා |
| | ගුරුගෙන් වන උවදුරු දුරු | වේවා |
| 06. | මරුවන් රකුසන් හොඳ මඟ | යොදවා |
| | එතුමන් එපුරිස් දම් නම් | වූවා |
| | සිකුරුගෙ මෙන් මුදු ගති ගුණ | වේවා |
| | සිකුරුගෙ දෝසෙන් සැම ගැළ | වේවා |
| 07. | දෙව් මිනිසුන් හට හොඳ මඟ | පෙන්වා |
| | හිමියන් සැමහට සත්ථා | වූවා |
| | සෙනසුරුගේ මෙන් දුක වැටහේ | වා |
| | සෙනසුරුගෙන් උවදුරු දුරු | වේවා |
| 08. | නුවණින් නිවනෙහි හරයන් | දුටුවා |
| | එබැවින් හිමි බුද්ධෝ නම් | වූවා |
| | රාහුගෙ මෙන් හිස් බව නොම | වේවා |
| | රාහුගෙ උවදුරු හැම දුරු | වේවා |
| 09. | ලොව ඇති උත්තම සුවයම | ලැබුවා |
| | එබැවින් හිමි භගවා නම් | වූවා |
| | කේතුගෙ මෙන් දර දඬු ගති | නේවා |
| | කේතුගෙ අපලෙන් සැනසුම | දේවා |

# යමෙකු රෝගී වූ අවස්ථාවක

(ලොව පහල වූ සියලු බුදුවරුන්ගේ අනන්ත අප්‍රමාණ මහා ගුණස්කන්ධයට ඖෂධ පූජාවන් සිදු කොට මෙසේ අධිෂ්ඨාන කරන්න).

අනේක කෙලෙස් රෝගයන්ගෙන් පෙළෙමින් සසර දුක් විඳි අසරණ සත්ව සමූහයා වෙත පහලවූ මහා කරුණාවෙන් සාරා සංඛ්‍ය කල්ප ලක්ෂයක් මුළුල්ලෙහි මහත් ආයාසයෙන් දානාදි සමතිස් පෙරුම් දම් පුරා, සව්කෙලෙසුන් නසා සර්වඥපද ප්‍රාප්ත වූ මාගේ භාග්‍යවත් බුදු රජාණන් වහන්සේලා, සත්වයින්ගේ සකල කායික, මානසික රෝගයන් මතු කිසි කලෙක නූපදිනා පරිදි සුව කිරීමට සමත් ශ්‍රේෂ්ඨ වෛද්‍යවරයාණෝය.

මාගේ ඒ භාග්‍යවත් බුදු රජාණන් වහන්සේ අනාදිමත් කාලයක පටන් සත්වයනට වැළඳී ඇත්තා වූ ලෝභ, ද්වේෂ, මෝහ දෘෂ්ඨි, මාන ආදී සුව කිරීමට අතිශයින් දුෂ්කර වූ ක්ලේශ රෝගයන්ත සතර සතිපට්ඨානයෝය, සතර සම්‍යක් ප්‍රධානයෝය, සතර ඍද්ධිපාදයෝය, පඤ්චේන්ද්‍රිය පඤ්ච බලයෝය, සප්ත බෝජ්ජංගයෝය, අෂ්ඨ මාර්ගාංගයෝය යන සත් තිස් බෝධි පාක්ෂික ධර්ම ඖෂධයන්ගෙන් සුව කළ සේක.

මාගේ ඒ භාග්‍යවත් බුදුරජාණන් වහන්සේ ලෝකයේ අන් කිසිවෙකු විසින් පැවැත්විය නොහෙන සාමුක්කංසික චතුරාර්ය සත්‍ය දේශනය නමැති අමා ඔසුවෙන් සූවිසි අසංඛ්‍යයන් සත්වයන්ගේ කෙලෙස් රෝග නැසූ සේක.

දිව්‍ය, බ්‍රහ්ම, මනුෂ්‍ය, අමනුෂ්‍ය, ලෝකත්‍රයේ සැමට වෛද්‍ය වූ, සව් සතුන්ටම පිහිට වූ, මහා කාරුණික වූ මහා වෛද්‍යවරයාණන් වහන්සේලාට මම නමස්කාර කරමි. මතු නූපදිනා පරිදි සකල රෝගයෙන් සුව කිරීමට සමත් වූ, සියලූ දුක් ගිනි නිවීමට සමත් වූ,

ඒ මහා වෛද්‍යවරයාණන් වහන්සේලා මම සරණ යමි. ඒ වෛද්‍යවරයාණන් වහන්සේලාගේ ශ්‍රාවක වෙමි. ඒ මහා වෛද්‍යවරයාණන් වහන්සේලාට මාගේ නමස්කාරය වේවා!
ඒ භාග්‍යවත් බුදු රජාණන් වහන්සේලා වදාළ වූ සියළු කෙලෙස් රෝග නසන්නා වූ, සියළු දුක් ගිනි නිවන්නා වූ, නව ලෝකෝත්තර ශ්‍රී සද්ධර්ම රත්නය නමැති ඖෂධ රත්නයට ද මාගේ නමස්කාරය වේවා!

ඒ සද්ධර්ම සංඛ්‍යාත ඖෂධ රත්නය සේවනය කිරීමෙන් කෙලෙස් රෝග සංසිඳවා පවිත්‍ර වූ, අෂ්ඨාර්ය පුද්ගල මහා සංඝරත්නයටද මාගේ නමස්කාරය වේවා!

තුන්ලෝකාග්‍ර වූ, භාග්‍යවත් වූ, අරහත් වූ සම්‍යක් සම්බුද්ධ දස බලධාරී සර්වඥරාජෝත්තමයන් වහන්සේ ගේ ප්‍රථම අභිනීහාරයේ සිට බෝධි මණ්ඩලය තෙක් පූරණ ලද අනන්ත අපරිමාණ බෝධි සම්භාර ආනුභාව බලයෙන් ද, දශබල ඥාන චතු ව්‍යාරද ඥානානුබලයෙන් ද, සෝළස මහා ඥාන අෂ්ඨාරස ආවේණික බුද්ධ ගුණානුභාව බලයෙන් ද,

සමතිංසත් පාරමිතා ඥාන බලයෙන් ද, සත්තිස් බෝධි පාකෂික ධර්මදාන - සත්තිස් සමධර්මඥාන බලයෙන් ද, අටතිස් මංගල්‍ය ධර්මඥාන - අටතිස් ආරම්මණ විභක්ති ඥාන බලයෙන් ද, සම සතළිස් කර්මස්ථාන ඥාන චත්තාලීසාකර මහා විපස්සනා බලයෙන් ද, සූසාලිස් ඥාන වස්තු සමපණස් උදයව්‍යය ඥාන බලයෙන් ද, පරෝපණ්ණාස කුසල ධර්ම පරිච්ඡේදක ඥාන දෙසැටක් මිථ්‍යා දෘෂ්ටි පරිච්ඡේදක ඥාන බලයෙන් ද,

තෙසැත්තෑ ඥාන සත්සැත්තෑ ඥාන බලයෙන් ද, සතර මාර්ග ඥාන සතර ඵල ඥාන බලයෙන් ද, සූවිසි කෝටි ලක්ෂ වාර සමාපත්ති අර්හත් ඵල මහා වජ්‍රඥාන බලයෙන් ද, අනන්ත නය සමන්නාගත සමන්ත පට්ඨාන මහාප්‍රකරණ විෂයන්තර්ගත ගාම්භීර ඥානානුභාවබලයෙන් ද,

ඉන්ද්‍රිය පරෝපරියත්තේ ඥාන ආසයානුසයේ ඥාන බලයෙන් ද, යමක මහා ප්‍රාතිහාර්ය ඥාන - මහා කරුණා සමාපත්ති ඤාණානුභාව බලයෙන් ද, සර්වඥතා ඥාන - අනාවරණ ඤාණානුභාව බලයෙන් ද,

සූවාසූ දහසක් ධර්මස්කන්ධ බලයෙන් ද, ජීවමානව මහමෙව්නා උයනේ වැඩසිටින විජය ශ්‍රී බෝධි රාජයාණන් වහන්සේගේ, ශ්‍රීවා ධාතූන් වහන්සේගේ, ලලාට ධාතූන් වහන්සේගේ, කේශ ධාතූන් වහන්සේගේ ආනුභාව බලයෙන් ද, සත් බුදුවරයන් වහන්සේලාගේ ආනුභාව බලයෙන් ද, ලොව පහළ වී වදාළා වූ අනන්තාපරිමාණ සම්මා සම්බුදුරජාණන් වහන්සේලාගේ අනන්ත බුද්ධ ගුණානුභාව බලයෙන් ද, අනන්ත බුද්ධ ඥානානුභාව බලයෙන් ද, අනන්ත බුද්ධ තේජානුභාව බලයෙන්ද, රත්නත්‍රය සතු අසීමිත සූවිසි මහා ගුණානුභාව බලයෙන් ද, මෙම ආර්ය මාර්ගය පූර්ණය කර ගන්නට වෙර වීරිය දරන්නා වූ ආර්ය උත්තමයාණන් වහන්සේලාගේත් ආර්ය මාර්ගය පූර්ණය කර ගන්නට මහත් වෙර වීරිය දරන්නා වූ ගිහි පැවිදි සියලූ ලෝක සත්වයින්ගේත් සියලූ කායික, මානසික පීඩාවන් දුරින් දුරු වේවා! කායික මානසික සුවයෙන් යහපතින් අභිවෘද්ධියෙන් ජයග්‍රහණයෙන් යුතුව උතුම් වූ චතුරාර්ය සත්‍ය ධර්මය අවබෝධ කර ගැනීමට මෙම මහා පින උපනිශ්‍රිය සම්පත්තියක්ම වේවා!

ඒ වාගේම මේ මොහොතේ මා විසින් ඒකරාශී කරගත්තා වූ මේ අප්‍රමාණ මහා පින මාගේ මේ සසර පටන් ගත් දා පටන් මේ මොහොත දක්වාම මට උදව් උපකාර කළ සියලූ ලෝක සත්වයින්ටත් මේ සසර පටන් ගත් දා පටන් මේ මොහොත දක්වාම මා දැන හෝ නොදැන මගේ අතින් යම් අවැඩක් අසාධාරණයක් හිංගියක් හිංසාවක්, වරදක්, ප්‍රමාද දෝෂයක් සිදු වූ යම් කිසි ලෝක සත්වයකු සිටී නම් ඒ සියලූ ලෝක සත්වයින්ටත් මට සහ සම්බන්ධ වූ සියලූ ලෝක සත්වයින්ටත්, සියලූ ලෝක සියලූ සත්වයින්ටත් මහා කරුණාවෙන් යුතුව අනුමෝදන් කරමි. ඒ කළ උදව් උපකාර වලට කෘත උපකාර සැළකීමක් ම වෙත්වා. අවැඩ අසාධාරණයට, හිංගි හිංසාවට ලක් වූ සියලූ ලෝක සත්වයින්ට ද සියළු ලෝක සියලූ සත්වයින්ට ද මේ මහා පින යහපතින් අභිවෘද්ධියෙන් ජයග්‍රහණයෙන් යුතුව උතුම් චතුරාර්ය සත්‍ය අවබෝධ කර ගැනීමට හේතු වාසනා වේවා. උතුම් බුද්ධ ශාසනය ඉදිරියේ ඒ අවැඩ අසාධාරණයට ලක් වූ ලෝක සත්වයින්ගෙන්ද උතුම් බුද්ධ ශාසනයෙන් ද මම කමාව ගමි. මට කමාව ලැබෙත්වා! මට කමාව ලැබෙත්වා! මට කමාව ලැබෙත්වා! මා මේ මොහොතේ පටන් නිදහස් පුද්ගලයෙක් බවට පත් වෙත්වා!

## වැරදි කමා කර ගැනීම

උතුම් සම්බුදු පියාණන් වහන්සේලා උදෙසා වේවා. උතුම් වූ ශ්‍රී සද්ධර්ම රත්නය උදෙසා වේවා, උතුම් වූ මහා සංඝ රත්නය උදෙසා වේවා, ලොව කවරෙකු උදෙසා වේවා, සිත, කය, වචනය යන තිදොරින් කවදා හෝ පටන් මේ මොහොත දක්වා අංශු මාත්‍රයක අවැඩක්, අසාධාරණයක්, වරදක්, ප්‍රමාද දෝෂයක් අප අතින් කිසි විටෙකත්, කිසිවෙකුටත් සිද්ධ නොවේවා. සම්බුද්ධ ශාසනය කෙරෙහි අංශු මාත්‍රයකින් වත් සිද්ධ නොවේවා. ඒ සියළු වැරදි ප්‍රමාද දෝශයන් සම්බුදු පියාණන් වහන්සේලා ඉදිරිපිට මෙසේ කමා කරමි.

**කායේන වාචා චිත්තේන**
**පමාදේන මයාකතං**
**අච්චයං කමමේ භන්තේ**
**භූරිපඤ්ඤ තථාගත///**

## පින් අනුමෝදනා කිරීම

උතුම් වූ ත්‍රිවිධ රත්නයේ අනන්ත අප්‍රමාණ වූ මහා ගුණස්කන්ධයන් සිහි කරමින්ද, උතුම් වූ සීල, සමාධි, ප්‍රඥා ගුණ වඩමින් ද සිදු කළා වූ මේ වන්දනාමාන පුද පූජාවන් හේතු කොට ගෙන උදා වුනා වූ මහා පුණ්‍යස්කන්ධය සතර වරිගයක ඥාතීන්ද, දිව්‍ය බ්‍රහ්ම මනුෂ්‍ය කියන්නා වූ සියලූ ලෝක සත්වයෝද අනුමෝදන් වෙත්වා!

මේ කරනු ලබන්නා වූ ශාසන ආශිර්වාදයන් ඒ අය වෙත විහිදී, පැතිරී, පිහිටා සුඛිත මුදිත වෙත්වා! කිසි කලෙකත් දුගතියක් නොවෙත්වා! යහපතක් අභිවෘද්ධියක් ම වෙත්වා! නිවන් සාක්ෂාත් කරගැනීමට හේතු වාසනා වෙත්වා!

**ආකාසට්ඨා ච භුම්මට්ඨා**
**දේවා නාගා මහිද්ධිකා**
**පුඤ්ඤං තං අනුමෝදිත්වා**
**චිරං රක්ඛන්තු ලෝක සාසනං ///**

**යම් කිසි මිත්‍යා දෘෂ්ටික ඥාති බලවේග හෝ**
**අමනුස්ස බලවේග හෝ කවුරු හරි ඇත්නම්**
**ඒ අයට දස අකුසල් දුරු කර ගන්නත්,**
**දස කුසල් වඩන්නත්,**
**දස පුණ්‍ය ක්‍රියා කරන්නත්,**
**ඒ වගේම සම්‍යක් දෘෂ්ටික සුගති අත්බැව් ලබන්නත්,**
**මේ පුණ්‍ය කුසල ආශිර්වාදය**
**හේතු වාසනා වේවා!**
**හේතු වාසනා වේවා!**
**හේතු වාසනා වේවා!**

## ප්‍රාර්ථනය

මේ වන්දනාමාන පූජාවන්ගේ අනන්ත වූ පුණ්‍ය බලය හේතු කොට ගෙන සසර වසනා තුරු මට අසත් පුරුෂ ඇසුරක් නොවේවා. නිවනට පත්වීම සඳහා සත් පුරුෂ ඇසුරක්ම වේවා.

**ඉමිනා පුඤ්ඤ කම්මේන**
**මා මේ බාල සමාගමෝ**
**සතං සමාගමෝ හෝතු**
**යාව නිබ්බාන පත්තියා**

සාධු! සාධු! සාධු!

එසේම මේ පුණ්‍ය ශක්තිය හේතු කොට ගෙන සියලූ ආශ්‍රවයන් දුරු වේවා. සියලූ දුකින් මිදෙත්වා.

**ඉදං මේ පුඤ්ඤං**
**ආසවක්ඛයා වහං හෝතු**
**සබ්බ දුක්ඛා පමුච්චතු**

සාධු! සාධු! සාධු!

යං කිංඤ්චි රතනං ලෝකේ
විජ්ජති විවිධාපුතූ
රතනං බුද්ධ සමං නත්ථි
රතනං ධම්ම සමං නත්ථි
රතනං සංඝ සමං නත්ථි
තස්මා සොත්ථි භවන්තු මේ
තස්මා සොත්ථි භවන්තු තේ

**සාධු! සාධු! සාධු!**

## මෙම ධර්ම ග්‍රන්ථය මුද්‍රණයට දායකත්වය ලබා දුන් පිංවත් පිරිස

හතරවන මුද්‍රණය සඳහා මූල්‍යමය දායකත්වය

සම්පත් විජේකෝන් මහතා
මහේෂි රම්මොහොට්ටි මහත්මිය
දම්සිත් විජේකෝන් පුතණුවන්
චන්දන සිරිවර්ධන මහතා
ගයාන් සිරිවර්ධන මහතා
එරන්දිකා ශ්‍රිවන්ති මහත්මිය
එම්. ඩබ්ලිව්. චමිලා ගයත්‍රී මහත්මිය
ෂමේන්ද්‍ර ෆර්නැන්ඩෝ මහතා
එන්. එච්. ඩී. කුසුමලතා මහත්මිය
උදයමාලි රාජපක්ෂ මහත්මිය
අරවින්ද ප්‍රියංකරගේ මහතා
කසුන් ආරියදාස මහතා
නදීකා යාපා මහත්මිය
ප්‍රභාත් උදයංග මහතා
ප්‍රභා කුලරත්න මහතා
සුලක්ෂණා අමරගුණසේකර මහත්මිය
ඉන්ද්‍රා ගුණරත්න මහත්මිය
ගයාන් දසනායක මහතා
හර්ෂා සෙනෙවිරත්න මහත්මිය
පිනිපා නිමානි මහත්මිය
ඩබ්ලිව්. ජී. එල්. එල්. සවර්ණසිංහ මහතා
කුමුදුනී වික්‍රමසිංහ මහත්මිය
කමලාවතී වීරසිංහ මහත්මිය
චන්ද්‍රානි සුනිල්ලතා මහත්මිය
ඊ. එම්. ප්‍රදීපිකා කුමාරි මහත්මිය
අනෝමා වීරසිංහ මහත්මිය
මල්ලිකා රණසිංහ මහත්මිය
ශ්‍යාමලා දිල්රුක්ෂි මහත්මිය
හේමාල් ද කොස්තා මහතා
මනෝරි අතුකෝරාළ මහත්මිය
සුගතදාස ද කොස්තා මහතා
ලලිතා ෆොන්සේකා මහත්මිය
ජීවනී ද කොස්තා මහත්මිය
තිරන්ජී පෙරේරා මෙනෙවිය
චාමර බාලසූරිය මහතා
දිමුතු පෙරේරා මහතා
ධනුෂ්කා සෝමසිරි මහත්මිය
සුමනාවතී වෙල්ගම මහත්මිය
ක්‍රිෂාන් සිරිමාන්න මහතා
චමරි හෙට්ටිආරච්චි මහත්මිය
අසන්ත හෙයියන්තුඩුව මහතා
රුපිකා විජේසිංහ මහත්මිය
සෙනෙහෙලතා කස්තුරිරත්න මහත්මිය

මෙම පිංවත් පිරිස ඇතුළුව මෙම ධර්ම ග්‍රන්ථයේ සෝදුපත් බලා දීමට කාරුණික වූ නීතිඥ චන්දන සිරිවර්ධන මහතාටත්, පියසීලී ද. අල්විස් මහත්මියටත්, බැසිල් ප්‍රේමරත්න මහතාටත්, ප්‍රභා කුලරත්න මහතාටත්, ගයාන් දසනායක මහතාටත්, පරිගණක පිටු සැකසුම කර දුන් ගොඩගම පිනකල් නෙට් ආයතනයේ දිසානායක මහතාටත්, නදීශානි අල්විස් මෙනවියටත්, මහරගම යූ.එන්. ප්‍රින්ටර්ස් ආයතනයේ ටී.ජී. උපේක්ෂා බුද්ධිනී

මෙනවියටත් මෙම ධර්ම ග්‍රන්ථය මනා සේ ඔබ අතට පත් කිරීමට මුද්‍රණ කටයුතු වලදී සහයෝගය ලබා දුන් ඩී. සී. ආර්. ඇක්සස් මුද්‍රණාලයේ කාර්යමණ්ඩලයටත්,

ඒවාගේම අවසාන වශයෙන් මෙම සද්කටයුත්ත සාර්ථක කර ගැනීමට ක්‍රියාවෙන් හෝ වචනයෙන් හෝ ශ්‍රම කඳුලකින් හෝ චිත්තප්ප්‍රසාදයෙන් උදව් උපකාර කළ ආශිර්වාද කළ සියලුම පිංවතුන්ටත් මෙම ධර්ම ග්‍රන්ථය පරිශීලනය කරන පිංවතුන්ටත් මෙම සද්කාරය උතුම් වූ ධර්මාවබෝධය පිණිසම හේතු වී සතර අපාගත සතුන් ඇතුලුව සියලූ ලෝවාසීන් වෙත නිර්මල දහම් ශාන්තිය පැතිරේවායි ප්‍රාර්ථනා කරමි.

ඒවාගේම ඉහත නම් සඳහන් පිංවත් පිරිස ඇතුළුව ආධාර උපකාර කළ සියලු දෙනා සිදුකරගත් මේ පුණ්‍ය කුසල ආශිර්වාද හේතු කොටගෙන එම පිංවතුන්ගේ පවුල් වල මියගිය දෙමාපියන්ටත් දූ දරුවන්ටත්, සහෝදර සහෝදරියන්ටත්, නෑදෑ හිතවතුන්ටත්, ඒ වාගේම අනන්ත සසර ගමනේ පටන් මේ මොහොත දක්වා තම තමන් අතින් අවැඩ අසාධාරණයන්ට වැරදි ප්‍රමාද දෝෂයන්ට ලක් වූ සියලූ දෙනාට මෙන්ම උදව් උපකාර කළ සැමටත්, මිය ගිය සතර වරිගයක ඥාති හිතමිත්‍රාදීන්ටත් මෙම පුණ්‍ය කුසල ආශිර්වාදයන් විහිදී පැතිරී පිහිටා සුඛිත මුදිත වෙත්වා. සුගතිගාමීව තම තමන්ගේ පැතුම් පරිදි නිර්වාණ අවබෝධයටද හේතු වාසනා වේවා. එම ආධාර උපකාර කළ පින්වත් පිරිස් ඇතුළු සිය පවුල් වල අයටත් කරන කියන යහපත් රැකි රක්ෂා ව්‍යාපාර ආදියෙන් සියලූ ජයග්‍රහණයන් අත් වේවා! කායික මානසික පීඩා දුරු වේවා! දූ දරුවන්ගේ අධ්‍යාපන ආදී කටයුතු වලින් විශිෂ්ඨ ජයග්‍රහණ අත් වී සුචරිත පිරිසක් වී සියලූ අභිවෘද්ධිය ද උදා වේවා! කියා ප්‍රාර්ථනා කරමි.

**චායා සංජීවනී විජේසූරිය**
**38 1/3, පරණ පාර, නාවින්න, මහරගම.**